රාජ්‍ය දැව සංස්ථාව
அரசாங்க மரக் கூட்டுத்தாபனம்
STATE TIMBER CORPORATION



2023
වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

පාරිභෝගික විශ්වාසය දිනාගත් දැව කර්මාන්තයේ සැබෑ නායකත්වය
நுகர்வோரின் நம்பிக்கையை வென்ற அரிமரக் கைத்தொழிலில் உண்மையான தலைமைத்துவம்
REAL LEADERSHIP OF THE TIMBER INDUSTRY THAT WON CONSUMBER TRUST


වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
வனஜீவராசிகள் மற்றும் வன வளங்கள் பாதுகாப்பு அமைச்சு
MINISTRY OF WILDLIFE AND FOREST RESOURCES CONSERVATION



රාජ්‍ය දැව සංස්ථාව

වාර්ෂික වාර්තාව - 2023

දැව වෙළෙඳපොළෙහි සැඩෑ නායකත්වය උදෙසා



රචනය හා සැකැස්ම	පියුමි මානිකා නිරෝෂා වර්ණකුලසූරිය
යතුරු ලියනය	නිරෝෂා වර්ණකුලසූරිය
නිර්මාණය/මුද්‍රණය	නිල්වන් ග්‍රැෆික්ස් - 011-2678966 - nillwanlk@yahoo.com

1968 - 2023

55 වසරක නොනිමි ගමන් මග රාජ්‍ය දැව සංස්ථාව

ජන හද දිනූ ආයතනයක්
ලෙස පෙරටම

දැක්ම

ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය ඉසිලීම.

මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම, කීර්තිනාමය හා නිපුනතාවය උපයෝගී කරගනිමින් නීත්‍යානුකූලව, පරිසරහිතකාමී අන්දමින් ජාතික අවශ්‍යතාවය අනුව අපගේ ගැනුම්කරුවන්ගේ දැව සහ දැවමය භාණ්ඩ ඉල්ලීම නිෂ්පාදනය කර ලබාදීම.

අනර්ඝතම දැවමය නිෂ්පාදන

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968.04.04 දිනැති හා අංක:14796 දරණ ගැසට් පත්‍රය මගින් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරණ රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1969 නොවැම්බර් 07 දිනැති අංක 14879 දරණ ගැසට් පත්‍රය, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 අති විශේෂ ගැසට් නිවේදනය, 2001 වර්ෂයේ ජුනි 26 දිනැති අංක:1190/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ 2008 පෙබරවාරි 25 දිනැති අංක:1538/7 දරන ගැසට් පත්‍ර අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5 කි. වර්ෂ 55කට වැඩි අත්දැකීම් හා පළපුරුද්ද ඇති ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ප්‍රමිතියෙන් යුතු ගෘහ භාණ්ඩ අවශ්‍යතා ඇති හෝටල් හිමිකරුවන්ගේ, රජයේ ආයතනවල සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ඇතුළු පෞද්ගලික ගැනුම්කරුවන්ගේ ප්‍රමුඛ තේරීමක් බවට පත්ව ඇත.

රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ගුණාත්මක බවින් යුතු අනර්ඝතම දැවමය නිෂ්පාදන පාරිභෝගිකයින් හට සැපයීමට හා උපරිම සේවාවක් ලබාදීමට හැකි සෑම අවස්ථාවකදීම උත්සාහ දරයි. අලංකාර නිවාස, සුඛෝපභෝගී හෝටල්, විධායක කාර්යාල ඇතුළු විදේශීය වාසස්ථාන සඳහා ද, අපගේ අනර්ඝ දැව ඉහළ වටිනාකමක් එක් කරයි. මනා ලෙස කළමනාකරණය කරන ලද වනවගා මඟින් ලබාගනු ලබන වටිනා දැව මඟින් කරනු ලබන සුවිශේෂී නිෂ්පාදන වන කාර්යාල හා නිවාස සඳහා වූ ගෘහ භාණ්ඩ, කඳන් හා ඉරු දැව අපගේ පාරිභෝගිකයන් උපරිම තෘප්තිමත්භාවයට පත්කිරීමට සමත් වේ. කීර්තිමත් රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව පුළුල් පරාසයක පැතිරුණ ඉහළ පෙළේ හා දීර්ඝ කල්පැවැත්මක් ඇති දැවමය නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන අතර, නිෂ්පාදන නවීන තාක්ෂණයෙන් යුතු අධි තාක්ෂණික යන්ත්‍රෝපකරණවලින් සමන්විත නවීන වැඩ පරිසරයක් තුළ නිපදවනු ලබයි.

සිත් ඇදගන්නා සුළු පුටු අසුන්වල සිට සුවිශේෂී නිදන කාමර කට්ටලයන් දක්වා පාරිභෝගිකයන් විසින් ඉල්ලුම් කරනු ලබන මිළට හා කාල වකවානුව තුළ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව, නිෂ්පාදන ලබාදීමේ හැකියාව රාජ්‍ය දැව සංස්ථාව සතුව පවතී. අපගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය අප විසින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගන්නා පහත දක්වා ඇති ක්‍රියාමාර්ග තුළින් සනාථ කරනු ලබයි.

- තිරසාරව කළමනාකරණය කරන ලද වනවගා මගින් ලබාගනු ලබන පරිණත දැව අපගේ නිෂ්පාදනයන් සඳහා යොදාගනු ලැබීම.
- ඵලය හා දෝෂ රහිත, ඉහළ ශ්‍රේණියේ දැව භාවිතා කරනු ලැබීම.
- මනා ලෙස පරිරක්ෂණය කරන ලද දැව භාවිතය.
- නවීන නිෂ්පාදන ක්‍රියාවලි සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය.
- ගුණාත්මකභාවය සහ සහතික කරන ලද අනෙකුත් දැව නොවන අමුද්‍රව්‍ය භාවිතය.
- එකලස් කිරීමේ හා නිම කිරීමේ නවීන ශිල්පක්‍රම භාවිතය.

නිෂ්පාදනවල ගුණාත්මකභාවය හැරුණුවිට, සංස්ථාව මගින් සපුරාලනු ලබන සියලුම ආකාරයේ ගෘහ භාණ්ඩ අවශ්‍යතා සඳහා නොමිලේ ඇස්තමේන්තු කිරීමේ සේවාවක් සහ මිනුම් සේවාවක් සපයනු ලබයි. තවද, ඉහළ ප්‍රතිලාභ සහිත අපගේම පිරිවිතරයන්ට අනුව නිෂ්පාදනය කරන ලද උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩ පරාසයක් වෙළෙඳපොළට සැපයීමට අපි සහතික වෙමු. අපගේ නිෂ්පාදන පරාසයන් පුළුල් කිරීමට අමතරව විශේෂයෙන් අපගේ සේවාවන් සහ ගනුදෙනුකරුවන් සඳහා සේවා පරිසරය ද අපි නිරන්තරයෙන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ද සහතික වෙමු.

අපගේ කාර්යයන්



නිවාස හා සේවා ස්ථාන ඉදිකිරීම සඳහා තිරසාර දැවමය අමුද්‍රව්‍ය සැපයීම



තිරසාර වන කළමනාකරණ ක්‍රමෝපායන් යොදාගනිමින් පරිසරය ආරක්ෂා කිරීමටත් වර්ධනය කිරීමටත් දායක වීම



පුළුල් පරාසයක පැතිරුණ නවීන හා සම්ප්‍රදායක ගෘහ භාණ්ඩ සැපයීම



මූල්‍ය වශයෙන් ස්ථායී ආයතනයක් ලෙස දීර්ඝ කාලයක් පාරිභෝගියකයින් හට භාණ්ඩ හා සේවා සැපයීම



ආදායම් බදු හා භාණ්ඩාගාර බදු ගෙවමින් ප්‍රජා සංවර්ධනය සඳහා දායක වීම





පටුන

	පිටුව
මූල්‍ය ප්‍රකාශන විශේෂ දත්ත	08
ආයතනික තොරතුරු	09
කළමනාකරණ මඩුල්ල	10
සභාපතිතුමාගේ සමාලෝචනය	13
සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය	16
අපගේ කාර්යභාරයන් හා අපගේ ව්‍යාපාරික වටිනාකම්	20 - 21
අධ්‍යක්ෂ මණ්ඩලය	22
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල	23
අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය	24
අපගේ ආවරණ කලාප	28
ආයතනික පාලනය	29
විගණන කමිටු වාර්තාව	32
අවදානම් කළමනාකරණය	34
ආයතනික සමාජ වගකීම	39
ව්‍යාපාරික සාරාංශය	49
දශකයක තොරතුරු	52
විගණකාධිපති වාර්තාව	53
වාර්ෂික ගිණුම්	61
මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව	84

මූල්‍ය ප්‍රකාශන විශේෂ දත්ත

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 Rs. '000	2022 Rs. '000	වෙනස %
ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත			
පිරිවැටුම	4,092,128	4,743,049	-14%
බදුවලට පෙර ලාභය	1,273,734	1,015,986	25%
භාණ්ඩාගාරයට ගෙවූ බදු	649,461	320,000	103%
ආදායම් බදු	117,943	380,105	-69%
ආදායම් බදුවලට පෙර ලාභය	1,155,791	635,881	82%
හිමිකම් මත ඉපැයීම්	14.4%	8.3%	74%
වත්කම් මත ඉපැයීම්	12.1%	6.6%	82%
ශේෂ පත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත			
මුළු වත්කම්	9,562,930	9,588,286	0%
මුළු හිමිකම්	8,006,788	7,665,155	4%
මුළු ණය	1,556,142	1,923,131	-19%
ණය/හිමිකම්	19%	25%	-23%
ණය/මුළු වත්කම්	16%	20%	-19%
වෙනත් තොරතුරු			
මුළු සේවකයන් (සංඛ්‍යාව)	1,390	1,500	-7%
එක් සේවකයෙකුට ආදායම	2,943.98	3,162.03	-7%
එක් සේවකයෙකුට ලාභය (බදුවලට පෙර*	916.36	677.32	35%





ආයතනික තොරතුරු - 2023.12.31

ගරු පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය - වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාතුමිය

ආර්.එම්.සී.එම්.හේරත් මිය - ලේකම්, වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය

බී.එස්.ගුණරත්න මහතා	- සභාපති - රාජ්‍ය දැව සංස්ථාව
ඊ.ඒ.පි.එන්.එදිරිසිංහ මහතා	- අධ්‍යක්ෂ - වන සංරක්ෂක ජනරාල්
එච්.පී.කේ.පෙරේරා මහතා	- අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත
සී.වික්‍රමරත්න මහතා	- අධ්‍යක්ෂ
චන්දන පෙරේරා මහතා	- අධ්‍යක්ෂ
කේ.ඒ.ඩී.එස්.සී.කේ.කතුරුසිංහ මහතා	- අධ්‍යක්ෂ
ඊ.ආර්.කුලතුංග මහතා	- අධ්‍යක්ෂ
දර්ශනි සමරවික්‍රම මිය	- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණන කමිටුව

එච්. පී.කේ. පෙරේරා මහතා	- කමිටු සභාපති
චන්දන පෙරේරා මහතා	- කමිටු සාමාජික
චමින්ද වික්‍රමරත්න මහතා	- කමිටු සාමාජික

විගණක

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

ප්‍රධාන බැංකුව

ලංකා බැංකුව

මුදල් වර්ෂය

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා

දුරකථන : +94-11-2866600-5

ෆැක්ස් : +94-11-2866623

වෙබ් අඩවිය : www.timco.lk

කළමනාකරණ මඩුල්ල - 2023

සාමාන්‍යාධිකාරි/ ප්‍රධාන විධායක නිළධාරි	ආචාර්ය නිමල් රුවන්පතිරණ	Ph.D., M.Sc (Foresty), B.Sc(Bio.Sc), B.A.F.(Forest Mgt-Germany), M.I.Bio.(SL)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)	ජී.ඩී.එස්. කුමාරසිංහ මයා	MBA, B.Sc(Acc.Fin.Mgt), FCA, ACCA, ACMA.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන)	එම්.ඒ.සි.එන්. සමරසිංහ මයා	MPM, B.Sc (Business Studies), Ad.Dipl in Mgt &Admin)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) වැ.ආ	පී.පී. තිසර ගමගේ මයා	MBS, B.Sc (Physical Science)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි)	ඩබ්.බි. සමන්ත මයා	MBM, M.Sc (Forestry), B.Sc, N.Dip in Teaching)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නිෂ්පාදන හා ඉංජිනේරු) වැ.ආ	පී.පී. තිසර ගමගේ මයා	MBS, B.Sc (Physical Science)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන) වැ.ආ	එච්.එම්.එස්. මාධව මයා	MCPM, PGD(com), B.com(Sp) Dip in Internal Auditing
සහකාර සාමාන්‍යාධිකාරි (කලාප)	පි.කේ. අජිත් චන්දන මයා	B.Sc (Hon.), MBS, HRM.Dip
සහකාර සාමාන්‍යාධිකාරි (කලාප)	එච්.බි. රජවත්ත මයා	B.A, MBS
සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ පුහුණු හා සංවර්ධන)	ආචාර්ය සී කේ. මුතුමාල	PhD in Agricultural, Engineering, M.Sc. (Forestry), B.Sc.(Agri.) Hon. Dip. in English.

කළමනාකරුවන්

කළමනාකාර (මුදල්)	පි.ටි.එන්. බෝවත්ත මිය	
කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු)	ඒ.කේ. ලසිත එඩිමන්ඩ් මයා	B.Sc. (Engineering)
කළමනාකාර (මිලදීගැනීම් හා නාවික)	එච්.එම්.පී.බී. හේරත් මයා	HNDA, FM(ABE)UK, PGD. (Fin.) MBA(UK)
කළමනාකාර (තොරතුරු තාක්ෂණ) වැ ආ	ජේ.එම්.එම්.බී ජයසුන්දර මයා	B.Sc. (sp) Hon.
කළමනාකාර (ආරක්ෂක)	සී. වීරමන් මයා	
කළමනාකාර (සිල්පර හා විදුලිකණු)	ඩී.එම්.එන්.පුෂ්පකුමාර නිල්මිණි මයා	B.Sc (N.S)
කළමනාකාර (මුදල්) වැ.ආ	යූ.එස්. මඩවල මයා	HNDA, MAAT

ප්‍රාදේශිය කළමනාකාරුවන්

ප්‍රාදේශිය කළමනාකාර (බණ්ඩාරවෙළ)	ඩී.එච්. රාජපක්ෂ මයා	M.Sc (Forestry), B.Sc
ප්‍රාදේශිය කළමනාකාර (මාතර)	ඩබ්.අයි. සාරංග මයා	B.Sc (Hon)
ප්‍රාදේශිය කළමනාකාර (ප්‍රධාන කාර්යාලය)	ආර්. විජේතුංග මයා	B.Sc(Agri.)Sp
ප්‍රාදේශිය කළමනාකාර (ප්‍ර.කා)	එච්.පී.එස්. දිසානායක මයා	BA
ප්‍රාදේශිය කළමනාකාර (කුරුණෑගල)	යූ.එස්.එම්. ප්‍රනාන්දු මයා	BA (Sp), MBS
ප්‍රාදේශිය කළමනාකාර (අම්පාර)	යූ.පී.එච්. උළුවඩුගේ මයා	B.Sc
ප්‍රාදේශිය කළමනාකාර (කොළඹ)	එම්.ඩී.සී. සම්පත් මයා	BA
ප්‍රාදේශිය කළමනාකාර (රත්නපුර)	එච්.එල්. නන්දන මයා	B.Sc, MBS.
ප්‍රාදේශිය කළමනාකාර (නුවර) වැ.ආ	ඩී.ඒ. හෙන්දාවිතාරන මයා	Dip (Forest Technology) NVQ 05, MBS.
ප්‍රාදේශිය කළමනාකාර (නුවරඑළිය) වැ.ආ	සුනිල් ජයරත්න මයා	
ප්‍රාදේශිය කළමනාකාර (අනුරාධපුර) වැ.ආ	ඩී.එල්. අබේනායක මයා	
ප්‍රාදේශිය කළමනාකාර (යාපනය) වැ.ආ	එම්.ඩබ්.ඩබ්.බී. මුදන්නායක මයා	BA

නියෝජ්‍ය කළමනාකාරුවන්

කළමනාකාර (නීති)	කේ.අයි.ඩී.පී කාරියවසම් මිය	LLB, Attorney at Law
නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ නිර්මාණ හා තත්ත්ව ආරක්ෂණ) කල්දෙමුල්ල	ඊ.එම්.එම්. ප්‍රනාන්දු මයා	
පද්ධති විශ්ලේෂක	ඩබ්.එච්.ඒ. චන්ද්‍රකුමාර මයා	B.Sc
නියෝජ්‍ය කළමනාකාර (මුදල) බූස්ස	ඒ.එල්. තුෂාරි ද සිල්වා මිය	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) නුවරඑළිය	එන්.ටී.එස්.කේ.පී. තිලකවර්ධන මයා	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) නුවර	ඩබ්.එම්.ජී.එම්. විජේසිංහ මයා	B.Sc(Busi.Admin), MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) මාතර	ඒ.ජේ. පුෂ්පකුමාර මයා	B.Sc (Bus.Admin) MA
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) මින්නේරිය	එම්.ඩී.පී.එම්. දිසානායක මිය	B.Sc (Acc), MBS
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) ප්‍රධාන කාර්යාලය	එස්. විතානගේ මිය	
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) අනුරාධපුර	ඩබ්.කේ. ජයසිංහ මයා	
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) කොළඹ	එස්.පී.ඒ.ජේ.සි. සමරකෝන් මයා	B.Sc (Finance) Sp
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) ප්‍ර කා	එස්.එම්. හේවගේ මයා	B.Sc, Bus.Admin. (Bus. Econ.sp), MBS
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) කුරුණෑගල)	එස්.එච්.අයි. ප්‍රසාද් මයා	B.Sc, Bus.Admin. (Bus. Econ.sp),MBS
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) ප්‍ර කා	ඩී.කේ.ජී.ජී. පුෂ්පකුමාර මයා	B.Com., MBA, MAAT, PGD.Acc. & Fin.

නියෝජ්‍ය කළමනාකාර (අලෙවි)	ඩබ්.ඩි.ඒ.එස්. තිලකරත්න මයා	
නියෝජ්‍ය කළමනාකාර (දූව ශ්‍රේණිකිරීම් හා වෙන්දේසි)	ඩී.පී.කේ.එස්.ජී. සමරවික්‍රම මයා	B.Sc (Mkt.Mgt)
නියෝජ්‍ය කළමනාකාර (දූව සැපයීම්)	බී.ඒ. නලින් දේශප්‍රිය මයා	
නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ නිර්මාණ)	එච්.එම්.ටී.එස්. අබේරත්න මිය	MBA, B. Design (Hon)
නියෝජ්‍ය කළමනාකාර (ඉරුම්හල්)	එම්.පී.එන්. අරුණ ශාන්ත මයා	B.Sc (Bus.Admin)
නියෝජ්‍ය කළමනාකාර (විමර්ෂන)	එස්.ඒ.ඩී. නිරෝෂන් මයා	B.Sc (Bus.Mgt)
නියෝජ්‍ය කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු) - කල්දෙමුල්ල	එම්.කේ.එම්. අක්තාර් මයා	B.Tech
නියෝජ්‍ය කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ)	ඩබ්.එම්.අයි.එච්. වීරසූරිය මයා	B.Sc
නියෝජ්‍ය කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ) බූස්ස	එච්.එම්.එල්.කේ.ජී. හේරත් මයා	B.Sc
නියෝජ්‍ය කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ) අම්පාර	ඩබ්.එම්.අයි.එච්. වීරසූරිය මයා	B.Sc
නියෝජ්‍ය කළමනාකාර (නිෂ්පාදන) ප්‍ර.කා	අයි.එම්.අයි.එස්.කේ. වික්‍රමසිංහ මයා	PgD (Fin, & Mathematics), B.Sc

ගෘහභාණ්ඩ සංකීර්ණ කළමනාකරුවන්

නියෝජ්‍ය කළමනාකාර) කල්දෙමුල්ල.	එච්.එම්.යූ.පී. සෝමවීර මයා	BLE, Dip IT & Mgt
නියෝජ්‍ය කළමනාකාර (ගෘ.භා සංකීර්ණය) අම්පාර	ආර්.එස්. පල්ලියගේ මයා	B.Sc (Bus.Admin)
නියෝජ්‍ය) කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ) බූස්ස	එච්.එම්.එල්.ඊ.ගුණසේකර හේරත් මයා	B.Sc

නියෝජ්‍ය ප්‍රාදේශිය කළමනාකරුවන්

නි.ප්‍රා.ක. (නුවර)	ඩබ්.ඒ.එස්. විජේසේකර මයා	
නි.ප්‍රා.ක. (මින්නේරිය)	කේ.එම්.පි.ටී.සි. කපිලරත්න මයා	
නි.ප්‍රා.ක. (අම්පාර)	යූ.පේ.ජී. ඒකනායක මයා	
නි.ප්‍රා.ක. (බණ්ඩාරවෙල)	ආර්.සී. සමන් කුමාර මයා	
නි.ප්‍රා.ක. (මොණරාගල)	එස්.සී. ජයමාන්න මයා	B.Sc
නි.ප්‍රා.ක. (මාතර)	කේ. චන්ද්‍රසේන මයා	
නි.ප්‍රා.ක. (කොළඹ)	එස්.බී. උඩගෙදර මයා	BA
නි.ප්‍රා.ක. (මාතර)	පී. හෙට්ටිආරච්චි මයා	B.Sc
නි.ප්‍රා.ක. (රත්නපුර)	එස්.ඒ මනෝජ් තුෂාර මයා	
නි.ප්‍රා.ක. (කුරුණෑගල)	ආර්.පී.පී.ඩී. ජයසිංහ මයා	
නි.ප්‍රා.ක. (අනුරාධපුර)	එස්.එම්.එස්. සිරිවර්ධන මයා	
නි.ප්‍රා.ක. වැ.අ. (මාතර)	එච්.ආර්.එම්.එස් ගුණසේකර මයා	



සභාපතිතුමාගේ සමාලෝචනය

බී. එස්. ගුණරත්න
සභාපති

ව්‍යාපාරික ක්ෂේත්‍රයට අහිතකර ලෙස බලපෑ අයහපත් ආර්ථික හා දේශපාලන පරිසරයක් මධ්‍යයේ වුවද ප්‍රශංසනීය කාර්ය සාධනයක් වාර්තා කරමින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කරනුයේ මහත් වූ සතුටිනි. සංස්ථාවේ නොසැලෙන කැපවීම සහ දරාගැනීමේ හැකියාව හේතුවෙන් පෙර නොවූ අභියෝග හමුවේ වුවද මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය අඛණ්ඩව පෙන්නුම් කළේය.


2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වර්ෂය පුරා අප විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන්, සංස්ථාවේ ආදායම රු.4,092,128,811.00 හා බදු සහ රජයේ අයකිරීම්වලට පසු ලාභය රු.506,329,836.00 ලෙස සැලකිය යුතු ආදායමක් සහ ලාභාංතිකයක් ලබාගැනීමට හැකිවිය. තවද, ආර්ථික හා මූල්‍ය අභියෝග මධ්‍යයේ රාජ්‍ය දැව සංස්ථාවේ ව්‍යාපාරික කටයුතු මධ්‍යස්ථව පවත්වාගෙන යනු ලැබූ අතර, මෑතකාලීන ආර්ථික අර්බුධය හේතුවෙන් රට අත්විඳින ලද දරුණුතම ව්‍යසනයට මුහුණපෑමට ද සිදුවිය. විදේශ විනිමය සංචිත වේගයෙන් ක්ෂය වීම, මුදල් අවප්‍රමාණය වීම, දරුණු උද්ධමනය සහ ඉහළ පොලී අනුපාත හේතුවෙන් විදේශ ණය බැඳීම් ආපසු ගෙවීමට අපහසුවීම වැනි අභියෝග අප ආයතනය කෙරහි ද තදින් බලපෑවේය.

මානව සම්පත සංස්ථාව සතු වටිනාම වත්කම බව අපගේ විශ්වාසයයි. 2023 වසර තුළදී, සංස්ථාවේ ඉලක්ක සාක්ෂාත් කර ගනිමින් අපගේ ගනුදෙනුකරුවන්ට හැකි ඉහළම මට්ටමින් සේවය කිරීමට කැපවී සිටින සේවකයින්ගේ කුසලතා සහ නිපුණතාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පුහුණු සහ සංවර්ධන වැඩසටහන් අපගේ කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩව සිදුකරනු ලැබූහ.


මූල්‍ය කාර්ය සාධනය

2023 වසරේ ආර්ථික අවපාතය තුළ වුවද, 2023 මූල්‍ය වසරේදී රු. මිලියන 4,092 ක ආදායමක් වාර්තා කළ අතර, 2022 වසරේ වාර්තා වූ රු. මිලියන් 4,743 ට සාපේක්ෂව 14%ක අඩු වීමක් සිදු වී ඇත. එහෙත්, මෙම පසුබැසීම තුළ හෝ, බදු පෙර ලාභය රු. මිලියන 1,273 ක් සහ 2023 වර්ෂයේ බද්දෙන් පසු ලාභය රු. මිලියන 506 ක් ලෙස වාර්තා කළේය.

බදු පෙර ලාභය සහ බදු පසු ලාභය 2022 වසරට සාපේක්ෂව පිළිවෙලින් 25% සහ 60% කින් වැඩිවී තිබේ. තවද රාජ්‍ය ආයතනයක් ලෙස මෙම අසීරු කාලසීමාව තුල වුවද අප රු. මිලියන 649 ක් රාජ්‍ය භාණ්ඩාගාරයට ලබා දී ඇති බව ආඩම්බරයෙන් වාර්තා කරමු.



එසේම, බදුවලට පෙර සංස්ථාවේ සාමාන්‍ය වත්කම් ප්‍රතිලාභ අනුපාතය (ROA) 2022 වසරේ 6.6% සිට 2023 වසරේ 12% දක්වා ඉහළ ගොස් ඇත. බදුවලට පසු සාමාන්‍ය කොටස් ප්‍රතිලාභ අනුපාතය (ROE) 2022 වසරේ 9% සිට 2023 වසරේ 15% දක්වා ඉහළ ගොස් ඇති අතර, මෙම අගයන් තුලින් පෙන්නුම් කරනුයේ සියලුම වත්කම් සහ කොටස් ආදායමට විශාල දායකත්වයක් ලබා දුන් බවයි. එබැවින්, ආයතනය නිවැරදි කාර්යභාර මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යන්නේ යැයි පෙන්වනු ලබයි.



ඉදිරි පියවර

ශ්‍රී ලංකාවේ කෙටි සහ මධ්‍යකාලීන අනාගතය අස්ථාවර විය හැකි බව පෙන්නුම් කරනු ලබන අතර, දිගුකාලීන ස්ථාවරත්වය සඳහා විශාල දේශපාලනික පරිසරයක් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහායෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. එහෙත්, අනාගතය පිළිබඳ මා අවංකවම සාර්ථකවේ යැයි යන අරමුණින් සලකා බලන අතර, නව දේශපාලන සංස්කෘතියක් සහ ශක්තිමත් ආර්ථික කළමනාකරණ මාර්ගෝපදේශ පවත්වාගෙන යාම ශ්‍රී ලංකාවේ දිගුකාලීන සමෘද්ධියට හොඳම පියවරක් බව අපි බලාපොරොත්තු වෙමු.

අපගේ ව්‍යාපාරයේ ස්වභාවය අනුව, තවදුරටත් තිරසාර ලෙස ආරක්ෂාකාරීව පත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව මා විශ්වාස කරමි. අපගේ ශක්තිමත් සංවිධානාත්මක හැකියාවන් නිසා ඉදිරියේ දී තවත් බොහෝ අවස්ථාවන් ලබාගත හැකිවනු අතර, අපි මුහුණ දෙන තරඟකාරීත්ව අභියෝග පිළිබඳව නිවැරැදිව අවධානයෙන් සිටිමින් ඒ සඳහා නව සංවර්ධන ප්‍රාග්ධන පියවර ගන්නෙමු.

අභියෝගාත්මක නව වසරට උපාය මාර්ගික සැලැසුම් සකස් කර ඒම සැලැස්ම ක්‍රියාත්මක කරමින්, අතරමැද ඒය සමාලෝචනය කරමින් නව සැලසුම් සකස්කරමින් ඉතාමත් ශක්තිමත් පදනමක් මත ව්‍යාපාරය අභියෝග හමුවේ වුවද ගමන් කළ හැකි බව අපි විශ්වාස කරමු.

මා විශ්වාස කරනුයේ රාජ්‍ය දැව සංස්ථාව අභියෝගයන්ට මුහුණ දීමට සූදානම්ව සිටින, අපගේ ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා අවස්ථා සොයා ගැනීමට හැකියාව ඇති බවයි. එසේම, අපගේ කීර්තිමත් වෙළඳ නාමය තවදුරටත් ව්‍යාප්ත කිරීමට සහ අපගේ අනෙකුත් අදාළ සාධක ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

අපි අපගේ වටිනාකම් වැඩි කරමින් උනන්දු වීම මගින් අපගේ කාර්ය සාධනය ගොඩ නැගීමට කටයුතු කරමින්, ආරක්ෂාකාරීව ඉදිරියට යනු ඇත. එසේම, වර්තමාන රජයෙන් ලබා දෙන අනුග්‍රහයන් අපි දේශීය නිෂ්පාදනයන් වර්ධනය කර ඒවා අපනයන කිරීමට ද උත්සහවන්තව කටයුතු කරන්නෙමු.

ස්තුතිය

වනජීවී හා වන සංරක්ෂණ ගරු අමාත්‍යතුමිය, රාජ්‍ය අමාත්‍යතුමන්, ලේකම්තුමන් සහ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය, වන සංරක්ෂණ ජනරාල් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සහ අනෙකුත් සියලුම රජයේ නිලධාරීන් අප වෙත ලබා දුන් විශාල සහයෝගය පිළිබඳව මා ඉමහත් ස්තුතිය පළකරමි. රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී

සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙතද ඔවුන්ගේ දැනුම සහ කුසලතා සඳහා, විශේෂයෙන්ම ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම වෙනුවෙන් විශේෂ ස්තුතිය පළකරමි. 2024 වසර පහසු නොවනු ඇතැයි අප බලාපොරොත්තු නොවන නමුත්, අප කෙටි කාලීන අභියෝගයන් නොසලකා දිගු කාලීන අරමුණු පසුපස යමින්, හැකිතාක් හොඳම ප්‍රතිඵල ලබා දීමට යොමු වෙමු. අපගේ ඉලක්ක සපුරාගැනීමට දායකත්වය ලබාදුන් සියලුම අපෙග් පාරිභෝගිකයන්ට මෙන්ම, අපගේ සියලුම පාර්ශවකරුවන් වෙත ස්තුතිය එලකරමි.

ඉදිරියේදී රාජ්‍ය දැව සංස්ථාව දැව වෙළඳපොලේ ඉහළ මට්ටමේ ව්‍යාපාරිකයෙකු බවට පත්වනු ඇතැයි මා තරෙය් විශ්වාස කරන අතර, අවසන වශයෙන් මා සියලුම පාර්ශවකරුවන්ගේ සහෙය්ගය තවදුරටත් රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් බලාපොරොත්තු වෙමි.

බී. එස්. ගුණරත්න
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව



සාමාන්‍යාධිකාරී සමාලෝචනය

ආචාර්ය එන්. ඩී. රුවන්පතිරණ
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිළධාරී

රාජ්‍ය දැව සංස්ථාවට වසර 55ක් සපිරෙන 2023 වර්ෂයෙහි ද රටෙහි පැවති අස්ථාවර ආර්ථික තත්වය හමුවේ පැවති දුෂ්කරතා අභිබවායමින්, සමාලෝචිත වර්ෂය තුල දැව සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අභියෝග රැසකට මුහුණදීමට සිදුවූ නමුත්, පැවති දැව ඉල්ලුම සපුරාලීම සඳහා අපගේ උපරිම ශක්තිය නොඅඩුව ලබාදෙමින්, කැපවීමෙන් යුතුව අපගේ ඉලක්කගත ප්‍රතිඵල වෙත සාර්ථකව ළඟාවෙමින්, පෙර වසර 5 තුළදී මෙන්ම මෙම වසර තුළ ද ප්‍රසංශනීය කාර්ය සාධනයක් සනිටුහන් කිරීමට හැකිවීම පිළිබඳව රාජ්‍ය, දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස මා ලද සුවිශේෂී වරප්‍රසාදයක් ලෙස මම දකිමි.

එසේම බාහිර පාරිසරික හා සමාජීය දුෂ්කරතා මධ්‍යයේ ද ඕනෑම අභියෝගාත්මක තත්වයකට මුහුණ දෙමින් ඉදිරියේදී ද නොපසුබට උත්සාහයෙන් යුතුව නැගීසිටීමට අප සතුව ඇති සූදානම පිළිබඳව නිහතමානී ආඩම්බරයකින් යුතුව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

මෙහෙයුම් කාර්ය සාධනය

රාජ්‍ය දැව සංස්ථාවේ දැක්ම සහ මෙහෙවරට අනුකූලව, ගුණාත්මක දැව සහ දැව පදනම් කරගත් නිෂ්පාදන දැරිය හැකි මිලකට සැපයීමේ ජනතා අපේක්ෂාවන් සපුරාලීම අපගේ ප්‍රමුඛ කාර්යයයි. ශ්‍රී ලංකාවේ ගුණාත්මක බවින් ඉහළ ආර්ථික වටිනාකමක් සහිත සාර්ථක වන වගාවන් අවමවීම සහ තරඟකාරී දැව වෙළෙඳපොළ හේතුවෙන් මෙම වසරේ දී දැව ආශ්‍රිත නිෂ්පාදනවල ඉල්ලුම සපුරාලීම රාජ්‍ය දැව සංස්ථාවට විශාල අභියෝගයක් විය.

සංස්ථාව ආරම්භයේ සිටම රාජ්‍ය දැව සංස්ථාවේ මෙහෙයුම් ක්‍රියාවලිය රඳාපවතින්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නැවත වනවගා සඳහා මුදාහරින වනවගාවන් මෙන්ම, වන අපරාධ දැව සහ රජයේ ආයතන මගින් ලබාදෙන පරිත්‍යාග දැව මතය. මෙම දැව ප්‍රභවයන් භාවිතා කරමින් රාජ්‍ය දැව සංස්ථාව විසින් කඳන්, ඉරුදැව, සිල්පර, අලිවැටකණු, විදුලි සම්ප්‍රේෂණ කණු, වැටකණු හා ගෘහ භාණ්ඩ වැනි විවිධ දැව ආශ්‍රිත නිෂ්පාදනයන් නිපදවනු ලබයි. නමුත් වසර ගණනාවක් පුරා සාර්ථකවන වගාවන්

නිදහස් නොවීම හේතුවෙන් රටේ අපේක්ෂිත දැව ඉල්ලුම රාජ්‍ය දැව සංස්ථාව වෙතින් පමණක් සැපයිය නොහැකි වී ඇත. වැඩබිම් ආශ්‍රිත ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් සහ මිනිස් ශ්‍රමය ලබාදීමෙන් මෙහෙයුම් ප්‍රතිඵල වැඩිදියුණු කිරීම රාජ්‍ය දැව සංස්ථාවෙහි අපේක්ෂාවයි.

2023 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හෙක්ටයාර් 837.45ක් වන වගාවන් අස්වැන්න ලබා ගැනීම සඳහා ලැබී ඇත. එයින් හෙක්ටයාර් 626.92ක් තේක්ක වගාවන් විය. ශ්‍රී ලංකාවේ තේක්ක නිෂ්පාදන සඳහා ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් ඉදිරියේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තේක්ක වගාවන් වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට අපි උත්සාහ කරමු. කෙසේ වෙතත් 2023 දී රාජ්‍ය දැව සංස්ථාව විසින් කඳන් 93103m^3, ඉරූ දැව 4528m^3, විදුලි සම්ප්‍රේෂණ කණු 7039, සිල්පර 22879, අලි වැටකණු 1056, වටකණු 51863, වැට කණු 65290ක් සහ දර 34,930m^3 නිෂ්පාදනය කරන ලදී. තවද, රාජ්‍ය දැව සංස්ථාවෙහි 2023 වසරේදී ගෘහ භාණ්ඩවල නිෂ්පාදන වටිනාකම මිලියන 194 කි.

දැව කර්මාන්තයේ ප්‍රමුඛයා ලෙස ගුණාත්මක දැව ලබා දෙමින් අනෙකුත් දැව කර්මාන්තවලට සහයවීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකි විය. තවද, අපගේ නිෂ්පාදන නිතරම බලාපොරොත්තු වන අපගේ වටිනා පාරිභෝගිකයින්ට උසස් නිමාවෙන් යුත් අලංකාර, වටිනා ගෘහභාණ්ඩ සැපයීමට අප බැඳී සිටී. එම හොඳම තත්ත්වයේ නිෂ්පාදන ලබාදීමෙන් අප ඔවුන්ගේ විශ්වාසය ආරක්ෂා කර ඇත. එසේම, අපගේ නිෂ්පාදන සඳහා කැපී පෙනෙන අගයක් එක් කිරීමට සංස්ථාවේ ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර සඳහා ISO තත්ත්ව සහතිකය අප ලබාගෙන ඇත.

මූල්‍ය කාර්ය සාධනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයට අනුවබදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 1,273 ක් වූ අතර, එය 2022 ට වඩා වැඩි විය. 2022 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවේ බදු පෙර ලාභය රුපියල් මිලියන 1,015 කි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් දැව ලබා ගැනීම සඳහා විකුණුම් මිලෙන් 60%-65% ක් අතර ප්‍රමාණයක් ස්කන්ධභාගය ලෙස රාජ්‍ය දැව සංස්ථාව විසින් මහාභාණ්ඩාගාරය වෙත ගෙවා ඇත. රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය 70% කින් පමණ කඩා වැටී රටේ ආර්ථිකය ද අසතුටුදායක තත්ත්වයක පවතින අවස්ථාවක දැව සඳහා පාරිභෝගිකයන්ගේ ඉල්ලුම විශාල ලෙස අඩු විය. එවැනි පසුබිමක අපගේ පිරිවැය ආවරණය කරගැනීම සඳහා නිෂ්පාදනයන්හි මිල වැඩිකිරීමකින් තොරව දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත ලබාදීමට සේවකයෝ දැඩි වෙහෙසක් ගත්හ.

මෙම විශිෂ්ට ජයග්‍රහණය සම්පූර්ණයෙන්ම වියදම් පාලනය කිරීම සහ නව කාර්ය මණ්ඩල බඳවා ගැනීමෙන් තොරව දැනට සිටින සේවකයන්ගේ කාර්යක්ෂමතාව ඉහළම මට්ටමක පවත්වා ගැනීමේ ප්‍රතිඵලයකි. ආයතනයේ පුරප්පාඩු 800කට ආසන්න ප්‍රමාණයක් ඇති වුවද, නව බඳවාගැනීම් නතර කළ අතර, ජීවනවියදම් ඉහළ යෑම හේතුවෙන් විදේශ රැකියාවන් සඳහා යෑම පිණිස ඉල්ලා අස්වීම් සිදුවීමත් සමඟ සේවකයින් ප්‍රමාණය අවම මට්ටමට පැමිණියේය එබැවින්, රාජ්‍ය දැව සංස්ථාව බොහෝමයක් කටයුතු කරනු ලැබුවේ දැනට සිටින සීමිත කාර්යය මණ්ඩලය වෙත අමතර කාර්යයන් පැවරීම මගිනි.

නමුත්, අපහට ප්‍රමාණවත් සේවක බලකායක් සහ සේවකයින්ට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් ලෙස පැවතියේ නම්, මෙයට වඩා විශාල ජයග්‍රහණයක් කරා ළඟාවීමට හැකියාවක් ඇති බව මාගේ විශ්වාසයයි. එසේ වුවත්, මූල්‍ය පිරිවැය අවම කිරීම සඳහා විවිධ කළමනාකරණ පියවරයන් ගැනීමට සිදුවූ අතර, ප්‍රදේශික ඒකාබද්ධ කර එක් ප්‍රාදේශීය කළමනාකරුවකු විසින් ප්‍රාදේශික කිහිපයක් කළමනාකරණය කිරීම උදාහරණයක් ලෙස දැක්විය හැක. මෙහි ප්‍රධානතම අරමුණ වූයේ ප්‍රවාහන වියදම් අඩු කිරීමයි. එසේම, මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ මගින් සේවක සුභසාධන වියදම් සීමා කිරීම හා සේවකයන් ගෙන් උපරිම කාර්යක්ෂම ඵලදායී සේවාවක් ලබාගැනීම ද සිදුකෙරිණි. එසේම ප්‍රාදේශීක ඇගයීමේ ක්‍රමවේදය රාජ්‍ය දැව සංස්ථාවේ ඵලදායීතාවය වැඩි කිරීම සඳහා මූලික හේතුවක් වූ අතර, එය සේවකයින් සඳහා අභිප්‍රේරණයක් විය. එහෙත් මෙම අසීරුතාවයන් මැදරට තුළ

දැව සැපයුම අඛණ්ඩව පවත්ගෙන යාම අපහට විශාල දුෂ්කර කාර්යයක් විය. කෙසේ වෙතත්, මේවන විටත් රාජ්‍ය දැව සංස්ථාව දිවයින පුරා ක්‍රියාකාරී ජාලයකින් සමන්විතය. ප්‍රාදේශීය කාර්යාල 10ක්, දැව ගබඩා 51ක්, ප්‍රදර්ශනාගාර 9ක්, නිෂ්පාදන සංකීර්ණ 3ක් සහ ගෘහභාණ්ඩ කර්මාන්ත ශාලාවන් 3ක් පවති. තවද, 2022 වසරට සාපේක්ෂව විකුණුම් වියදම රු. මිලියන 2,183ක් ද, අලෙවිකරණ සහ බෙදාහැරීමේ වියදම රු. මිලියන 729ක් ද, පරිපාලන වියදම් රු.මිලියන 959 ක් වූ නමුත් රාජ්‍ය දැව සංස්ථාවට 2023 වසරේදී රු. මිලියන 4,092 ක ආදායමක් උපයා ගැනීමට හැකි විය.

ශ්‍රී ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යවසායකයන්ට ඔවුන්ගේ නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රයට අදාලව වාර්ෂිකව සම්මාන ලබාදීම සිදුකරයි. මෙම සම්මාන උළෙලේ ඇගයීමේ විධිමත් ක්‍රමවේදය අතිශයින්ම විනිවිදභාවයෙන් යුක්ත වන අතර, මෙහි ප්‍රධාන ඇගයීමේ ක්ෂේත්‍රයන් වනුයේ ආදායම, වටිනාකම වැඩිකිරීම, ඵලදායීතාවය, සේවකයින් සඳහා වන වගකීම්, වර්ධනය හා අනාගතය, පර්යේෂණ හා සංවර්ධන, තත්ත්ව සහතික කිරීම, පරිසර වගකීම, සෞඛ්‍යම, ආරක්ෂාව සහ සමාජ වගකීම්ය. රාජ්‍ය දැව සංස්ථාවට 2023 දී ජාතික මට්ටමේ නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා රාජ්‍ය අංශය යටතේ රිදී සම්මානය දිනා ගැනීමට හැකි විය. මෙම සම්මානය ලැබීම සඳහා අපගේ ප්‍රධාන ක්ෂේත්‍ර වන මෙහෙයුම්, මූල්‍ය, අලෙවිකරණ සහ මානව සම්පත්හි කාර්යයන් අභියෝගාත්මක තත්ත්වයන් මැද වුවද විශිෂ්ට ජයග්‍රහණය කරා ගෙන ගියහ.

සමාජ වගකීමේ (CSR) ක්‍රියාකාරකම් සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාවෙහි ප්‍රාදේශීක 10 තුළ පැළ තවාන් 28ක් පවත්වාගෙන යන අතර, වටිනා දැව සහ අනෙකුත් වනාන්තර ස්වභාවය මත අවශ්‍ය පැළ නිපදවා ගනී. පර්යේෂණ සංවර්ධන සහ පුහුණු කිරීමේ අංශය මඟින් රජයේ සහ පෞද්ගලික නොවන සංවිධාන වෙත මෙම පැළ නොමිලේ බෙදා හැරේ. 2023 වසරේදී විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා පැළ 39,226ක් බෙදා හැරිය අතර, 2023 වසරේදී රාජ්‍ය දැව සංස්ථාවේ තවාන් මඟින් පැළ 37,500ක් නිපදවා තිබුණි. රාජ්‍ය දැව සංස්ථාව දේශීය දැව කර්මාන්තය සුරැකීම සහ ජෛව විවිධත්වය වර්ධනය කිරීම සඳහා රුක් රෝපණ වැඩසටහන් හරහා දැව වර්ග ජනප්‍රිය කිරීමේ අරමුණ ඇතිව කාබන් තිරකිරීම් වැඩි කිරීම, ගස් ගහනය වැඩි කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම මඟින් දේශගුණික වෙනස්කම් මැඩ පවත්වා ගැනීමට කටයුතු කරයි. රාජ්‍ය දැව සංස්ථාව දැව තිරසාර ලෙස භාවිතා කිරීමට දායකවීම සඳහා Sustainable Development Goals (SDG) සමඟ වගකීම් සහිතව බැඳී සිටී.

එමෙන්ම රාජ්‍ය දැව සංස්ථාවෙහි සේවකයන් තම විෂයය ඵලදායී ලෙස කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ඊට අදාල පුහුණුවීම් පිළිබඳව නිතර අවධානය යොමු කරනු ලබයි. 2023 වසරේදී සේවකයන් 1061 ට අවශ්‍ය පුහුණු වැඩසටහන් 52ක් සඳහා බඳවා ගත් අතර, එහි වියදම රු.2,837,557 ක් විය. එමෙන්ම බාහිර පාර්ශවද සම්බන්ධ කරගනිමින් වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. 2023 වසරේදී විවිධ ක්ෂේත්‍රවල පුහුණුලාභීන් 445ට පුහුණුව ලබාදීමට හැකි විය. එසේම, දැව තාක්ෂණික පුහුණු ආයතනය (TTTI) විසින් NAITA අපේක්ෂකයන් සහ ඇගයීම් කමිටුව වෙත ඔවුන්ගේ එම කාර්යයන් ඉටුකරගැනීම සඳහා මෙවලම්, උපකරණ සහ ස්ථානය ලබා දීමෙන් උපකාර කළ අතර, 2023 වසරේදී සිසුන් 107ක් ඇගයීම් කළහ. එසේම දැව ක්ෂේත්‍ර යට අදාලව NVQ වැඩසටහන්ද පැවැත්වූ අතර, දැව ශිල්පියා ගේ කාර්යයන්ට වඩාත් උසස් කුසලතාවයක් ලබාදීමට එය උපකාර විය. ඊට අමතරව, 404ක් පමණ පුහුණුලාභීන් බාහිර පුහුණු වැඩසටහන් හරහා පුහුණු කරනු ලැබූහ. රාජ්‍ය දැව සංස්ථාවෙහි පර්යේෂණ සහ පුහුණු අංශය ආයතනයේ ව්‍යාපාරික අවශ්‍යතා මෙන්ම, නව දැනුමට අනුව ඊට අදාල සමාජ ගැටළු පිළිබඳව ද පර්යේෂණ කටයුතු සිදු කරයි.

රාජ්‍ය දැව සංස්ථාව නව දැනුම බාහිර සමාජයන් සමඟ බෙදා ගැනීම සඳහා පර්යේෂණ, සම්මන්ත්‍රණයන් සහ ලිපි ප්‍රකාශනය කිරීම හරහා ක්‍රියාකරයි. 2023 වසරේදී සමස්තයක් ලෙස පර්යේෂණ පත්‍රිකා 7ක් ප්‍රකාශයට පත් කරන ලදී. එසේම, දැව ආරක්ෂාකාරීව භාවිතා

කිරීම සහ වාණිජ වනවගා ජනප්‍රිය කිරීම සඳහා ප්‍රදර්ශනවලදී සක්‍රීයව මඟ පෙන්වනු ලැබීය. 2023 වසරේදී රාජ්‍ය දැව සංස්ථාව ප්‍රදර්ශන 4ක් සඳහා දායක විය.

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු අංශයේ ප්‍රධාන කාර්යයන් අතර දැව වර්ග හඳුනා ගැනීම සඳහා නවතම තාක්ෂණය භාවිත කිරීම, දැවවල පටක විද්‍යාත්මක ලක්ෂණ උපයෝගි කරගනිමින් දැව නිවැරදිව හඳුනාගැනීම සිදුකරන අතර, දැවවල ශක්ති ගුණාංග පරීක්ෂා කර වාර්තා ලබාදීම මෙන්ම දැව තුළට පරිරක්ෂක කාවැදීම පිළිබඳ පරීක්ෂණ වාර්තා ඇතුළු තත්ත්ව වාර්තා ලබාදීම සිදුකරයි. 2023 වසරේදී රජයේ සහ පෞද්ගලික සංවිධාන සඳහා දැව සහතික පත්‍ර 214ක් නිකුත් කරන ලදී.

අනාගත දැක්ම

වායු ගෝලයේ ඇති කාබන් ඩයොක්සයිඩ් දැව තුළ තිර කිරීම මගින් දීර්ඝ කාලයක් දැව භාවිතය තුළ කාබන් තැන්පත් කරගනිමින් වායු ගෝලීය කාබන් විමෝචනය කිරීම අවම කරයි. මෙමගින් දේශගුණ විපර්යාස අවම කිරීමට තිරසාර ලෙස දායකත්වය සපයයි.

වායු ගෝලීය කාබන්ඩයොක්සයිඩ් අඩු කිරීමට සහ කාබන් ගබඩා කරගැනීමට උපකාරී වන නිසා, දැව සහ දැව මූලික කරගත් නිෂ්පාදන වැඩිවශයෙන් නිෂ්පාදනය කිරීම වැදගත්ය. මෙය අරමුණ කරගෙන මෙම කාර්යයන් අනාගතයේදී ඉටු කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙහි කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි කරමින්, වැඩි පහසුකම් සහ සේවක අභිප්‍රේරණය වැඩි කිරීම මගින් ඉදිරියේදී කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

රාජ්‍ය දැව සංස්ථාවෙහි සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි ලෙස සේවය කළ පසුගිය වසර 5 තුළ ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් රුපියල් බිලියන 5ක මුදලක් ආයතනය නමින් තැන්පත් කර ඇත. සාමාන්‍යාධිකාරි ලෙස මෙය මාගේ ජයග්‍රහණයක් ලෙස සලකමි.

ස්තුතිය

පසුගිය වසර 5 තුළ සාමාන්‍යාධිකාරි ලෙස මා අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම් හා උපදෙස් මත උපරිම ලෙස කටයුතු කල අතර, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ස්තුතිය ප්‍රකාශ කරමි. සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය විසින් ලබා දුන් කැපවීම සඳහා මාගේ ගෞරවය පළකිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම, අපගේ පාරිභෝගිකයන් වෙතද මාගේ ස්තුතිය පළකරමි. මන්ද ඔවුන් අපගේ දැව සහ දැව-මූලික නිෂ්පාදන සඳහා විශ්වාසනීයභාවයක් ඇති කරනු ලැබිය. අපි ඔවුන්ට විශේෂ වූ නිෂ්පාදන ලබා දීමට සූදානම්ව සිටිමු.

එසේම වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියට, අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ ඔහුගේ උපකාරක කාර්ය මණ්ඩලයට ද මාගේ අවංක ස්තුතිය පළකරමි. තවද, වන සංරක්ෂක ජනරාල්තුමන් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට, ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සඳහා මාගේ ගෞරවය පළකරමි. රාජ්‍ය දැව සංස්ථාවේ සමස්ථ කාර්ය මණ්ඩලයට ද මාගේ අවංක ගෞරවනීය ස්තුතිය පළ කරමි. ඔවුන්ට ප්‍රමාණවත් පහසුකම් නොතිබුනද, විශාල අභියෝග පැවතිය ද නොසැලී සේවය කිරීම, ඔවුන්ගේ කැපවීම, ආයතනයට දක්වන ආදරය, නවෝත්පාදන ක්‍රියාවලිය සහ නොනවතින උත්සහයෙන් යුතුව කටයුතු කිරීම රාජ්‍ය දැව සංස්ථාව මෙන්ම, රට වෙනුවෙන් ද සේවය කිරීමක් වන බව අපි විශ්වාස කරමු.

මෙම තරඟකාරී වෙළඳපොළ තුළ සැමවිටම අප කෙරෙහි විශ්වාසය තබා අපගේ තත්ත්වය ඉහළම මට්ටමේ තබාගැනීමට ශක්තියක් වන අපගේ වටිනා පාරිභෝගිකයින් හට අපගේ ස්තුතිය ප්‍රකාශ කිරීමට මම අවසාන වශයෙන් කැමැත්තෙමි.



ආචාර්ය එන්.ඩී. රුවන්පතිරණ
සාමාන්‍යාධිකාරි / ප්‍රධාන විධායක නිළධාරි
රාජ්‍ය දැව සංස්ථාව

අපගේ කාර්යභාරයන්

- වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

- දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.

- දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

- දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.

- දැව ආනයනය කිරීම.

- වන වගාවල ව්‍යාපෘති ආරම්භ කිරීම. නැවත වනවගා කිරීම. කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

- දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.

- පෞද්ගලික ඉඩම්වලින් දැව මිලදීගැනීම හා ගබඩා හෝ මාර්ගස්ථානයේ තබා අලෙවි කිරීම.

- වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.

- වේවැල් ආනයනය කිරීම.

- නියැදි පරීක්ෂා කිරීම් මඟින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනාගැනීම සහ දැව සම්බන්ධසහතික නිකුත් කිරීම.

- දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

- සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැඟිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැළසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

- වනසංරක්ෂක ජනරාල්වරයාගේ අනුමැතිය මත කළුවර දැව ප්‍රධාන දැවය ලෙස යොදා නොගත් සහ නිර්මාණ අලංකරණය සඳහා පමණක් කළුවර දැව යොදාගෙන ඇති ගෘහ භාණ්ඩ අපනයනය කිරීම.

- දැව භාණ්ඩ දැවමය ගෘහ භාණ්ඩ හා දැවමය කලාත්මක නිෂ්පාදන පුද්ගලික අංශයෙන් මිළදී ගැනීම හා අලෙවි කිරීම.

- විදේශ ප්‍රදර්ශනාගාර හිමි ව්‍යාපාරික ආයතන සමග එළඹෙන ලද ගිවිසුම් යටතේ ගෘහ භාණ්ඩ අපනයනය කිරීම.

- අධිකරණ විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරන ලද විධාන සැලකිල්ලට ගනිමින් රාජසන්තක කරන ලද දැව හා දැව නිෂ්පාදන ගබඩා කිරීම හා විකිණීම.

- අධිකරණ විසින් කරනලද නියමවලට යටත්ව එම අධිකරණය විසින් ලබා දෙන ලද රාජසන්තක නොකරනලද දැව සහ දැව නිෂ්පාදන ගබඩා කිරීම හා විකිණීම.

අපගේ ව්‍යාපාරික වටිනාකම්

ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.

පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමනාකරණයට සම්බන්ධ සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටුකිරීමට අපි කැපවෙමු.

අපගේ ගනුදෙනුකරුවන්ට සහ සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා විශ්වාසයේ පදනම හරහා වටිනාකම් පෝෂණය කරමින් ඔවුන් සමඟ සදාචාරාත්මක - ව්‍යාපාරික සබඳතා ඇති කර ගැනීම අපගේ පැවැත්මට මූලික හේතුව බව අපි හඳුනා ගනිමු.

කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.

ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියලු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.

සියලුම මෙහෙයුම් කටයුතුවලදී සහ සේවා සැපයීමේදී ප්‍රමිතිය හා පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබාගන්නා බවට සහතික වන්නෙමු.

අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.

අධ්‍යක්ෂ මණ්ඩලය - 2023

බී.එස්.ගුණරත්න මහතා
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

ආචාර්ය කේ.එම්.ඒ.බණ්ඩාර
අධ්‍යක්ෂ (2023.01.23 - 2023.10.30)
වන සංරක්ෂරක ජනරාල්

ඊ.ඒ.පී.එන්.එදිරිසිංහ මහතා
අධ්‍යක්ෂ (2023.12.29)
වන සංරක්ෂරක ජනරාල්

එස්.ඒ.සී.කුලතිලක මිය
අධ්‍යක්ෂ (2023.01.23 - 2023.09.25)
භාණ්ඩාගාර නියෝජිත

එච්.පී.කේ.පෙරේරා මහතා
අධ්‍යක්ෂ (2023.10.30 - 2023.12.29)
භාණ්ඩාගාර නියෝජිත

සී.වික්‍රමරත්න මහතා
අධ්‍යක්ෂ

චන්දන පෙර්රා මහතා
අධ්‍යක්ෂ

කේ.ඒ.ඩී.එස්.සී.කේ.කතුරුසිංහ මහතා
අධ්‍යක්ෂ

ඊ.ආර්.කුලතුංග මහතා
අධ්‍යක්ෂ

ඩී.පී.කාරියවසම් මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (2023.01.23 - 2023.12.13)

දර්ශනි සමරවික්‍රම මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (2023.12.29)

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල - 2023

ආචාර්ය නිමල් රුවන්පතිරණ
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිළධාරී

ජී.ඩී.එස්. කුමාරසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

එම්.ඒ.සී.එන්. සමරසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)

ජී.ජී. තිසර ගමගේ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) (වැ/බ)

ඩබ්.බී. සමන්ත මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)

එච්.එම්.එස්. මාධව මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අභ්‍යන්තර විගණන) වැ.ආ

ජී.ජී. තිසර ගමගේ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නිෂ්පාදන හා ඉංජිනේරු) (වැ/ආ)

2023 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

රාජ්‍ය දැව සංස්ථාවෙහි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා අපගේ වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස අප සතුටට පත්වන්නෙමු.

හැඳින්වීම

රාජ්‍ය දැව සංස්ථාව 1968 ආරම්භ කරන ලද රාජ්‍ය ව්‍යාපාර ආයතනයකි. එය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද රාජ්‍ය ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය ''සම්පත්පාය'' බත්තරමුල්ල හි පිහිටා ඇති අතර, ප්‍රාදේශීය කාර්යාල දිවයින පුරා පිහිටා ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය දැව සංස්ථාව මූලික වශයෙන් තම ආදායම් උපයාගනු ලබන්නේ දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන අලෙවියෙනි.

ව්‍යාපාර සමාලෝචනය

රාජ්‍ය දැව සංස්ථාව ගුණාත්මකබව හා කැපීපෙනෙන කණ්ඩායම් හැඟීම මත ගොඩනැඟුණ විශ්වාසය පිළිබඳ අතීතයක් හා උරුමයක් ඇති කීර්තිමත් දැවැන්තයෙකි. ශ්‍රී ලංකාවේ ගුණාත්මක හා විශ්වාසදායීම දැව සැපයුම්කරු ලෙස රාජ්‍ය දැව සංස්ථාව එහි ආරම්භක වර්ෂය වන 1968 වසරේ සිටම තම ව්‍යාපාරය ගොඩනඟා ඇත. එමෙන්ම, මෙම ව්‍යාපාරය උදෙසා වන මාර්ගය සමෘද්ධිමත් අවසානයක් වෙත ගමන්ගන්නා මාර්ගයකි. නවෝත්පාදන අරමුණු, පාරිභෝගිකයන් කේන්ද්‍රීය කරගත් සැලසුම් තවදුරටත් ව්‍යාපාරයේ සාර්ථකත්වය හා වටිනාකම් ඉහළ නංවයි.


අවිනිශ්චිතතාවයන් හා ඉතා අභියෝගාත්මක පරිසරයක් තුළ වුවද, සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර කාර්ය සාධනයක් ලබා ඇත. ඒ තුළින් අපගේ පෙර වසර හා සමානව දුෂ්කර අවස්ථා තුළ නොසැලී සිටීමට රාජ්‍ය දැව සංස්ථාව සතු හැකියාව හා සූදානම මනාව පිළිබිඹු වේ.


තිරසාර නොවන ණය, උද්දමනය රුපියලේ උච්චාවචනය හා විදේශ විනිමය සංචිත හිඟය හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකය අස්ථාවර විය. එබැවින් විවිධ සමාජ ස්ථරවල සිටින සියලු ශ්‍රී ලාංකිකයින් පෙර නොවූ දුෂ්කරතාවලට මුහුණ දුනි. කෙසේ වෙතත්, ජාතික ආර්ථිකයට ඇති අභියෝග කෙටිකාලීන හා මධ්‍යකාලීන ලෙස අඛණ්ඩව පවතිනු ලබන නමුත්, මෙම අභියෝග නොතකා අගය උපරිම කිරීම සඳහා පිරිවැය ප්‍රශස්ථිකරණය, පරිමාව මත පදනම් වූ වර්ධනය කෙරෙහි ඉහළ අවධානයක් යොමුකිරීම, ජවසම්පන්න කළමනාකරණය ඇතුළු අප ලබාගත් අත්දැකීම් සහ දැනුම උපයෝජනය කරගැනීම තුළින් සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශක්තිමත් කාර්ය සාධනයක් ළඟාකර ගැනීමට රාජ්‍ය දැව සංස්ථාව සමත් විය.


මූල්‍ය කාර්ය සාධනය

ආර්ථික අර්බුදය හමුවේ පාරිභෝගික හැසිරීම වෙනස්වීම මත අපගේ ඇතැම් නිෂ්පාදන කාණ්ඩවල ක්‍රියාකාරිත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළේය. රාජ්‍ය දැව සංස්ථාව විසින් 2023 වර්ෂයේ ආදායම ලෙස රුපියල් මිලියන 4,092 ක් උපයා ඇති අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 14%ක පහළ බැසීමකි. එමෙන්ම, සංස්ථාව විසින් 2023 වර්ෂය සඳහා උපයා ඇති දළ ලාභය රුපියල් මිලියන 1,908 ක් වන අතර, එය පෙර වසරට සාපේක්ෂව 17% ක පහලයෑමකි.

කාර්ය සාධනය	2022	2023
	රු.මිලි	රු.මිලි
පිරිවැටුම	4,743	4092
දළ ලාභය	2290	1908
මෙහෙයුම් ලාභය	2324	2004
මෙහෙයුම් නොවන ආදායම්	14.9	14.5
භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ලාභය	1015	1273







සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් රුපියල් මිලියන 1,273 ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව 25.5% ක වර්ධනයකි. වටිනාකම් උපරිම කිරීම සඳහා පිරිවැය ප්‍රශස්තකරණය පිළිබඳ උපාය මාර්ග, පරිමාව මෙහෙයවන වර්ධනය කෙරෙහි ඉහළ අවධානයක් යොමුකිරීම සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම මෙම වර්ධනය ළඟාකර ගැනීම සඳහා හේතු වී ඇත.

රැකියා අවස්ථා ලබාදීම තුළින් ශ්‍රී ලංකාවේ විරැකියාව තවදුරටත් අඩුකිරීම සඳහා රජයට සහයවීම හා වෙළෙඳපොළට ගුණාත්මක නිෂ්පාදන සැපයීම රජයේ ආයතනයක් වශයෙන් රාජ්‍ය දැව සංස්ථාවෙහි වගකීමක් බව අප සළකනු ලබයි. 2023 වර්ෂයේ ආර්ථික අවපාතය යටතේ වුවද. සංස්ථා සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු කරමින් සේවක පිරිවැය ලෙස රුපියල් මිලියන 1,584 ක් වැයකර ඇත. 2023 වර්ෂයේ මුළු සේවක සංඛ්‍යාව 1,390 ක් වූ අතර. 2022 වසරේ 1,500 කි. මෙසේ ශ්‍රමබලකාය අඩුවීමට හේතුවී ඇත්තේ වර්ෂය තුළ සේවකයින් විශ්‍රාම ගැන්වීමයි. එසේම රාජ්‍ය ප්‍රතිපත්ති තීරණවලට අනුව අත්‍යවශ්‍ය පුරප්පාඩු සඳහා පමණක් සේවක බඳවාගැනීම් සිදුකර ඇත.

2022 හා 2023 වර්ෂ සඳහා වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම මත ප්‍රතිලාභ පහත පරිදි වේ.

	2022	2023
ROE	9%	15%
ROA	6.6%	12%

2022 වර්ෂයේ දී 6.6% ක් වූ බදු ගෙවීමට පෙර සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) 2023 වර්ෂයේ දී 12% දක්වා ඉහළ ගිය අතර, 2022 වර්ෂයේ දී 9% වූ සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ (ROE) 2023 වර්ෂයේදී ද 15% දක්වා ඉහළ නැගිණි. සමාලෝචනයට භාජනය වූ වර්ෂයෙහි රජයේ ආදායමට සංස්ථාවේ දායකත්වය රුපියල් මිලියන 763 වන අතර, රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවන ලද රු.මිලියන 649 ක බදුද එයට ඇතුළත් වේ.

නිෂ්පාදනය

මෙහෙයුම් ක්‍රියාවලිය පරිසර හිතකාමී වීම ගුණාත්මක ඉහළ නිෂ්පාදන මට්ටමක් පවත්වා ගැනීම සඳහා මෙන් ම ආයතනයේ පැවැත්මට සහ ලාභදායිතාවයට මෙන් ම ආයතනික අභ්‍යන්තර හා බාහිර සංරචකවල යහපැවැත්මට අත්‍යවශ්‍ය බව සංස්ථාව තරයේ විශ්වාස කරයි.

රජය විසින් පනවනු ලබන නීති හා රෙගුලාසිවලට එකඟතාවය දක්වමින් ඒවාට අනුකූලව කටයුතු කිරීම, ක්‍රමවත් වැඩබිම් වර්ගීකරණ ලැයිස්තුවක් සකස් කිරීම, විද්‍යාත්මක දැව නිස්සාරණය, නිවැරදි දැව පරිරක්ෂණ ක්‍රම භාවිතය, විධිමත් අයුරින් යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම, සේවකයින් බඳවාගැනීමේ සහ සංවර්ධනය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් ඇති කිරීම, සංස්ථාවේ අරමුණු හා පරමාර්ථ තිරසාර ආකාරයකින් ඉටුකර ගැනීමට ඉවහල් විය. එබැවින් ශ්‍රී ලංකාවේ තිරසාර වන කළමනාකරණය සඳහා දායකත්වය සැපයීම රාජ්‍ය දැව සංස්ථාවේ වගකීමකි.

ඊට අමතරව කර්මාන්තයේ ප්‍රතිවාදීන්ට වඩා තරඟකාරීව වාසි ලබාගැනීම සඳහා පහත සඳහන් උපයා මාර්ග ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය දැව සංස්ථාව අදහස් කර ඇත.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරනු ලබන වනවගා විද්‍යාත්මක දැව නිස්සාරණය කිරීම සඳහා කටයුතු කිරීම.
- වෙළෙඳපොළ සඳහා කඳන්, දුම්රිය දෙපාර්තමේන්තුව වෙත සිල්පර, විදුලිබල මණ්ඩලය සඳහා විදුලිකණු හා වනජීවී දෙපාර්තමේන්තුව සඳහා අලිවැටකණු මෙන්ම පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා ඉරුදැව නිෂ්පාදනය කිරීම.
- වාණිජ වටිනාකමින් යුතු දැව රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් හා පෞද්ගලික ඉඩම්වලින් මිලදීගැනීම.
- පරිත්‍යාග හා වනඅපරාධ දැව ලබාගැනීම.
- වනවගා වැඩසටහන් සඳහා ක්‍රියාකාරිත්ව සහභාගිවීම. (ක්‍රියාකිරීම හා සහභාගීවීම)
- දුම්රිය සිල්පර ආනයනය කර අගයක් එකතු කිරීමෙන් අනතුරුව ප්‍රති අපනයනය කිරීම.

රජයේ කැළෑවලින් දැව හෙළීම්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙළීම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වන වගා නිදහස් කරනු ලබන අතර 2022 හා 2023 වර්ෂවල හෙළීම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය පහත පරිදි වේ.

	පූර්ණ හෙළීම් (හෙක්ටයාර්)		තුනීකිරීම් (හෙක්ටයාර්)	
දැව විශේෂය	2022	2023	2022	2023
තේක්ක	450	626.92	300	504.42
යුකැලිප්ටස්	100.4	109.2	110	274
පයිනස්	47.53	52.43	-	8.5
කායා	-	-	181	245.6
ඇකේෂියා	18.4	48.9	-	-

ඉරු දැව බවට පරිවර්තනය කිරීම

2023 වර්ෂයේ ඉරුදැව ඝන මීටර් 4,528 නිෂ්පාදනය කර ඇති අතර 2022 වර්ෂය තුළදී ඉරුදැව ඝන මීටර් 3,432 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඝන මීටර් 2,623 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ගබඩා මගින් අලෙවි කර ඇත.

විදුලි කණු සහ සිල්පර පරිරක්ෂණය කිරීම

2023 වර්ෂය තුලදී සිල්පර 22,876ක් හා අලිවැටකණු 1,056ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බූස්ස පරිරක්ෂණාගාරවලින් පරිරක්ෂණය කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව සිල්පර නිෂ්පාදනය 89%කින් පහළ ගොස් ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ හා වනජීවී දෙපාර්තමේන්තුවේ විදුලි කණු හා අලිවැට කණු සඳහා ඉල්ලුම අඩුවීම හේතුවෙන් පසුගිය වසර වල පිළිවෙලින් 5,978ක් හා 1,056ක් ලෙස සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් රුපියල් මිලියන 194 ක් වටිනා ගෘහභාණ්ඩ 2023 වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත. ඒ අතර රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, නුවර, රත්නපුර, තලල්ල, බූස්ස, අම්පාර, බණ්ඩාරවෙල හා බත්තරමුල්ල ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් රුපියල් මිලියන 303 (බදු සහිත) ක් වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ අලෙවි කර ඇත.

තිරසාර නොවන ණය, විදේශ විනිමය හිඟවීම, උද්ධමනය, ඉහළ පොලී අනුපාත හා මුදල් අවප්‍රමාණය හේතුවෙන් ලංකාවේ මෙහෙයුම් පරිසරය තවදුරටත් පීඩනයට පත්වූ අතර එමගින් පුරවැසියන්ට හා ආයතනවලට දැඩි අභියෝගවලට මුහුණදීමට සිදුවිය.

මෙවැනි පසුබිමක් යටතේ අරමුණු මත හා මූල්‍ය ස්ථායීතාව මත පදනම්ව භාහිර පරිසරයෙහි

2022 - 2023 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම


		නිෂ්පාදන ප්‍රමාණය		අලෙවි ප්‍රමාණය		දළ පිරිවැටුම (රු.මිලියන)	
		2022	**2023**	**2022**	**2023**	**2022**	**2023**
කඳන්	ඝ.මී	103,121	93,103	102,491	85,378	3,624	3,081
ඉරුදැව	ඝ.මී	3,432	4,528	3,441	2,623	373	293
සිල්පර	ඒකක	34,113	22,876	30,969	31,292	603	715
විදුලි කණු	ඒකක	1,837	7,039	2,312	4,116	34	131
අලිවැට කණු	ඒකක	10,448	1,056	11,219	7,451	71	62.6
වට කණු	ඒකක	78,528	51,863	82,602	51,070	12	12
දර	ඝ.මී	93,785	34,930	75,710	50,319	69	69
වැට කණු	ඒකක	84,911	65,290	80,985	477,218	13	14
ගෘහභාණ්ඩ	රු.මිලි	292	194	-	-	428	303

ඉලක්ක හා ළඟාකරගැනීම් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය

රාජ්‍ය දැව සංස්ථාවෙහි කළමනාකාරිත්වය විසින් දෛනික මෙහෙයුම් කටයුතු වසර ආරම්භයේ ස්ථාපනය කරන ලද අරමුණුවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා හා අරමුණු සහ ඉලක්ක වසර අවසානයේ දී ළඟාකර ගැනීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ලබයි. ඒ අනුව ප්‍රගතිය අධීක්ෂණය කිරීම ඇතුළු එක් එක් කලාපයට අදාළව පවත්නා හා ඇති විය හැකි සියලු ගැටළු විසඳීම සඳහා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් සහ සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගිත්වයෙන් මාසික ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ රැස්වීමක් රාජ්‍ය දැව සංස්ථාවෙහි කළමනාකාරිත්වය විසින් පවත්වනු ලබයි.

සිදුවන වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්වීමට කඩිසර වන අතරම දැව වෙළෙඳපොළෙහි රාජ්‍ය දැව සංස්ථාව සඳහා ඇති ප්‍රමුඛ ස්ථානය තවදුරටත් ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමුකරනු ඇත. මේ අතර, අපගේ ප්‍රජාව කෙරෙහි අපගේ වගකීම අප වටහාගෙන ඇති අතර, අපගේ පාර්ශවකරුවන් හට ඉහල වටිනාකම් ලබාදෙමින් ඔවුන් සමඟ ඉදිරියට යාමට අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

අපගේ ආවරණ කලාප
ස්ථාන සිතියම - රාජ්‍ය දැව සංස්ථාව



ආයතනික පාලනය

රාජ්‍ය දැව සංස්ථාව තුළ ආයතනික පාලනයෙහි (Corporate governance) ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙනයාමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැපවී සිටින අතර, එහි වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

පාර්ශවකරුවන් සඳහා වන වගකීම් වෙත අවධානය යොමුකර ඇති බව සහතික කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව තුළ ආයතනික පාලන ප්‍රතිපත්ති සහ භාවිතයන් සැළසුම් කර ඇති අතර, එමගින් සංස්ථා සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින් සහ එය ක්‍රියාත්මක වන සියලුම ප්‍රජාවන් ඇතුළු එහි සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හඳුනා ගනී. මෙම ලිපිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ආයතනික පාලන ප්‍රතිපත්ති, භාවිතයන් සහ ක්‍රියාවලීන් පිළිබඳ පැහැදිළි කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි මෙහෙයුම්

අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංස්ථාව පාලනය කරනු ලබන අතර, සංස්ථාවේ ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සහ අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂකවරුන් හත් දෙනෙකුගෙන් සැදුම්ලත් අතර, ඉන් අධ්‍යක්ෂකවරුන් පස් දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර, අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නිල වශයෙන් පත්කරනු ලබයි.

සෑම රැස්වීමකටම පෙර, තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට අදාල සියලුම කළමනාකරණ තොරතුරු සහ පසුබිම් තොරතුරු සපයනු ලැබේ. සංස්ථාවේ කාර්යසාධනය, නව ආයෝජන, ප්‍රාග්ධන ව්‍යාපෘති සහ නිශ්චිත මණ්ඩල අනුමැතිය අවශ්‍ය වන වෙනත් ගැටළු පිළිබඳව මණ්ඩල පත්‍රිකා රැස්වීමට පෙර ඉදිරිපත් කරනු ලැබේ.

සංස්ථාවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සහ බාහිර පාර්ශවකරුවන් සමඟ නිරන්තර සම්බන්ධතා පැවැත්වීම, ප්‍රතිපත්ති සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් සභාපතිවරයා වගකිව යුතුය. තවද, සංස්ථාවේ සමස්ථ වාණිජ, මෙහෙයුම් හා උපායමාර්ගික සංවර්ධනයේ සියලු අංශ සඳහා ඔහු වගකිව යුතු අතර, ඒ සඳහා අනෙකුත් අධ්‍යක්ෂකවරුන් සහ ඉහළ කළමනාකාරිත්වයේ සහාය ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී තම අංශයට අදාල කරුණු සාකච්ඡා කරන විට ඉහළ කළමනාකාරිත්වයේ සාමාජිකයන් රැස්වීම අතරතුර අදාල අවස්ථාවේ පෙනී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්

- සංස්ථාවේ ව්‍යාපාර සහ කටයුතු මෙහෙයවීම
- සංස්ථාවේ මෙහෙයුම් සැළසුම් සඳහා පදනමක් ලෙස කෙටිකාලීන හා දිගුකාලීන උපාය මාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- ව්‍යාපාරයේ ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක බව සහතික කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් සහ ඵලදායී බව සහතික වීම.
- වාර්ෂික ප්‍රාග්ධනය සහ මෙහෙයුම් අයවැය අනුමත කිරීම සහ අයවැයට එරෙහිව කාර්යසාධනය සමාලෝචනය කිරීම.
- සංස්ථාවේ අවසාන මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම.
- නීති හා රෙගුලාසිවලට අනුකූලවීම සහතිකවීම.
- සියලුම ගිවිසුම්, අත්පත්කර ගැනීම් හෝ වත්කම් බැහැර කිරීම සහ ප්‍රාග්ධන ව්‍යාපෘති අනුමත කිරීම.

භාණ්ඩාගාරයෙන් පත්කරන ලද අධ්‍යක්ෂවරයා සංස්ථාව සමඟ සෘජු හෝ වක්‍ර ද්‍රව්‍යමය සබඳතාවක් නොමැතිව ස්වාධීන වන අතර, එම අධ්‍යක්ෂකවරයා සතු පුළුල් පරාසයක

විශේෂඥ දැනුම සහ වාණිජ ආයතනික සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ සැළකිය යුතු අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන දැක්මක් සහ විනිශ්චයක් ගෙන එයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු

සියලුම අනු කමිටු පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම, මෙම කමිටු සඳහා සාමාජිකයින් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම අනු කමිටු සඳහා වගකීම් පවරා ඇත.

විගණන කමිටුව

විගණන කමිටුව අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකු ගෙන් සමන්විත වන අතර, එම අධ්‍යක්ෂකවරුන් H.P.K. පෙරේරා මහතා - කමිටු සභාපති, චමින්ද වික්‍රමරත්න මහතා - කමිටු සාමාජික සහ චන්දන පෙරේරා මහතා - කමිටු සාමාජික වේ. සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ ප්‍රධානීන් අවශ්‍ය අවස්ථාවේදී විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වේ. පිටු අංක 32 හි විගණන කමිටු වාර්තාව, මූල්‍ය වර්ෂය තුළ කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් පැහැදිළි කරනු ලබයි.

අභ්‍යන්තර පාලන - Internal Controls

සංස්ථාවෙහි වත්කම් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ විශ්වාසදායක තොරතුරු ජනනය වන, නිවැරදි හා සම්පූර්ණ වාර්තා පවත්වාගෙනයාම සහතික කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. මෙම පද්ධතියට මූල්‍ය, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය ඇතුළු සියලුම පාලනයන් ඇතුළත් වන අතර, අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව විසින් අනුගමනය කරන ලද උපාය මාර්ග පිටු අංක 34 සිට 38 දක්වා අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්තාවේ දක්වා ඇත.

අවුරුදු 05ක කාලසීමාවක් ආවරණය වන උපාය මාර්ගික සැළසුම්වලට අමතරව, සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදීම පුළුල් අයවැය ක්‍රියාවලියක් ක්‍රියාත්මකවේ. වාර්ෂික අයවැය, තීරණාත්මක සාර්ථක සාධක හඳුනාගැනීම මගින් සියලු අංශ විසින් සකස් කරන ලද ක්‍රියාකාරී අරමුණු, මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර, සෑම මසකම එහි ප්‍රගතිය පරීක්ෂා කරනු ලබයි.

සංස්ථාවෙහි අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය නිතිපතා ඇගයීමට ලක්කරන අතර, එහි සොයාගැනීම් විගණන කමිටුව විසින් පළමුව සමාලෝචනය කරනු ලබන අතර, ඉන්පසුව සැළකිය යුතු ගැටළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය දැනට පවතින අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සමාලෝචනය කරන ලද අතර, එහි සඵලතාවය පිළිබඳව තෘප්තිමත්වේ.

පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතාවය

අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ යහපත් සබඳතාවක් පවත්වා ගැනීමේ ඇති වැදගත්කම හඳුනා ගන්නා අතර, සමස්ථ සංස්ථාව තුළම මෙය ඇති කිරීම සහතික කරයි. සංස්ථාව තුළ අභ්‍යන්තර සන්නිවේදනය ප්‍රධාන වශයෙන් විද්‍යුත් තැපෑල, සංදේශ සහ චක්‍රලේඛ හරහා සිදුකෙරේ.

සංස්ථාවේ ප්‍රතිපත්ති සහ භාවිතයන් සංස්ථාවේ වටිනාකම් සහ එහි සමාජ වගකීම්වලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරනු ලබන අතර, සංස්ථාව තම සේවකයින්ගේ සහ සංවිධානය තුළ සිටින අනෙකුත් අයගේ පරිසරය, සෞඛ්‍ය සහ ආරක්ෂණ ප්‍රමිතීන් ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කරයි. අදාල ක්‍රියාමාර්ග ආයතනික සමාජ වගකීම් වාර්තාවේ 39 සිට 48 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

අනුකූලතාවය - **Compliance**

රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් අභ්‍යන්තර අනුකූලතා ක්‍රියාපටිපාටි කෙරෙහි සැළකිය යුතු අවධාරණයක් ලබාදෙනු ඇති අතර, අනුකූලතාවය සහතික කිරීම සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS) සහ අනෙකුත් ව්‍යවස්ථාපිත රෙගුලාසිවල මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කර ඇත.

පැවැත්ම - **Going Concern**

සංස්ථාවේ මූල්‍ය තත්වය සහ මුදල් ප්‍රවාහ තත්වය මනාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී 'Going Concern' පදනම අඛණ්ඩව භාවිතා කර ඇත, සංස්ථාවේ ඉදිරි කාලය සඳහා එහි ක්‍රියාකාරිත්වය අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයෙහි විශ්වාසය වේ.

විගණන කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් වන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකියන සහ වාර්තා කරනු ලබයි.

විගණන කමිටුවෙහි මූලික කාර්යභාරය වන්නේ මූල්‍ය ප්‍රතිඵල, ව්‍යුහය, අවදානම් හා අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම, ගැටළු විසඳීම හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන්ට සහයවීම වේ. එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට, අදාල නීති හා අදාල බලධාරීන් විසින් කලින් කලට නිකුත් කරනු ලබන නීතිවලට අනුකූලවීම සහතික කරයි.

සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් පරිදි අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වේ.

සාමාජිකයින්ගේ නම	සහභාගීත්වය
එච්.පී.කේ.පෙරේරා මහතා - සභාපති	4/4
චමින්ද වික්‍රමරත්න මහතා - සාමාජික	3/4
චන්දන පෙරේරා මහතා - සාමාජික	2/4

තවද, වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, බාහිර විගණන (විගණකාධිපති) නිරීක්ෂකයන් ලෙස සහභාගීවේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් වූ එස්.ඒ.සී කුලතිලක මහත්මිය 2023 ඔක්තෝම්බර් මාසය දක්වා විගණන කමිටුවෙහි සභාපතිත්වය දරණ ලදී.

කුලතිලක මහත්මිය විසින් විගණන කමිටුවෙහි සභාපතිනිය ලෙස කටයුතු කළ කාලය තුළ දී කමිටුව වෙත ඇය දැක්වූ අගනා දායකත්වය සහ උපදේශනය පිළිබඳව කෘතවේදීත්වය මෙහි සනිටුහන් කිරීමට කැමැත්තෙමු.

රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් (04) පැවැත්විය.

මෙම අවස්ථාවට ආරාධනය මත සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන සහ තාක්ෂණ) වැ.බ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) සහභාගීවිය.

සමාලෝචිත වර්ෂය තුල විගණන කමිටුවෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්වල සාරාංශය

2023 තුළ විගණන කමිටුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදිය.

මූල්‍ය වාර්තාකරණය

අවදානම්, පාලන සහ පාලන ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් හරහා මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය පිළිබඳ සහතිකයක් සැපයීම සඳහා විගණන කමිටුවෙහි මූලික කාර්යයට අදාළව, එය අනුමැතිය සඳහා මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණනය) සමඟ සාකච්ඡා කර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කෙරිණි.

අභ්‍යන්තර විගණනය

වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධානත්වය දරන සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන කමිටුව සඳහා සහාය දක්වයි. අංශයේ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කර මණ්ඩලයේ අනුමැතිය සඳහා විගණන කමිටුව විසින් නිර්දේශ කරන ලදි. අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධනය වාර්ෂික විගණන සැලැස්මට එරෙහිව වාර්ෂික පදනමින් විගණන කමිටුව විසින් අනුමත කරනු ලැබේ. වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) පාලන ගැටළු සහ නිර්දේශ විස්තර කරන කාලාන්තර වාර්තා විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන අතර අතීත සහ වර්තමාන නිර්දේශ පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග නිරීක්ෂණය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන වාර්තා/පැවරුම් 41 ක් සිදු කර නිකුත් කරන ලද අතර ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සහිත ප්‍රධාන කරුණු ඉස්මතු කරන ලදී. මීට අමතරව, අංශය විසින් බාහිර විගණන ගැටළු පිළිබඳ සමාලෝචන පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කර යාවත්කාලීන කරන ලදී.

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය

සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණක සහ බාහිර විගණක (විගණකාධිපති) විසින් සපයන ලද වාර්තා විගණන කමිටුව විසින් අධීක්ෂණය කරන ලදී.

බාහිර විගණනය

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම බාහිර විගණකගේ මගපෙන්වීම ඇතිව සකස් කරන ලදී. වර්ෂය තුළ භාහිර විගණනය මගින් කරන ලද නිරීක්ෂණ නිරන්තරයෙන් සමාලෝචනය කර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. මීට අමතරව, විගණන කමිටුවෙහි රැස්වීම්වලදී තවදුරටත් වැඩිදියුණු කිරීම් සඳහා බාහිර විගණකවරයා සමඟ පුළුල් සාකච්ඡාවක් පවත්වන ලදී.

නිගමනය

සංස්ථාවේ මූල්‍ය කටයුතු සහ සංස්ථාවේ ප්‍රතිපත්ති පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කළමනාකරණය කරන බවට සාධාරණ සහතිකයක් ලබාදීමට, සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ප්‍රමාණවත් බවට විගණන හා කළමනාකරණ කමිටුව වශයෙන් සෑහීමකට පත්විය හැකිය.

විගණන කමිටුව වෙනුවෙන්,

එච්.පී.කේ.පෙරේරා
සභාපති - විගණන කමිටුව.

අවදානම් කළමනාකරණය

තිරසාර වර්ධනයක් මෙන්ම ආයතනික අරමුණු හා පරමාර්ථ ළඟා කරගැනීමෙහි ස්ථාවර ප්‍රගතියක් ලබාගැනීම සඳහා ව්‍යාපාර සහ මූල්‍ය අවදානම් කළමනාකරණය මූලික වශයෙන් වැදගත් වේ. ණඅවදානමඋ සහමුළුමනින් ම ''තුරන් කිරීමට'' නොහැකි සාධකයක් වන අතර, මෙහෙයුම් අඛණ්ඩව සමාලෝචනය හා උපාය මාර්ග අනුග මනය කරමින් අවදානම් ''අවම කිරීම'' සංස්ථාව සහතික කරයි. මෙම ඉලක්කය සපුරාගැනීම සඳහා විවිධ උපාය මාර්ග සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

අවදානම් පරිසරය

2023 මූල්‍ය වර්ෂය ඉතා අභියෝගාත්මක වසරක් විය. කෙසේ වෙතත්, ක්‍රියාශීලී නායකත්වය සහ දැව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම තුළින් මෙම අවිනිශ්චිතතාවයන් මඟහරවා අපගේ මූලික ව්‍යාපාරය සමඟ ශක්තිමත් ලෙස වර්ධනය විය හැකි බව අපගේ විශ්වාසයයි. තවද, විවිධාංගීකරණය වූ කර්මාන්තයක සිටීම අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ දී සංස්ථාවට ශක්තියක් වූ අතර, ආර්ථික අවපාත පසුබිම තුළ වුවද ස්ථාවර ප්‍රකෘතියක් ලබාගත්තෙමු.

අවදානම් පාලනය

අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් වන අතර, අවදානම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණ වගකීම ඇති විගණන කමිටුව විසින් මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය සහය ලබාදේ. අවදානම් හඳුනාගැනීම, මැනීම, කළමනාකරණය අවම කිරීම සහ අවදානම් අධීක්ෂණය මෙන්ම අභ්‍යන්තර විගණනයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් වාර්තා කිරීමට සෑම අංශ ප්‍රධානියෙකුම වගකීමෙන් බැඳී සිටී.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

රාජ්‍ය දැව සංස්ථාවෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සියලුම ආකාරයේ ව්‍යාපාරික හා මූල්‍ය අවදානම් මැනවින් හඳුනාගැනීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සහතික වන පරිදි සකස් කර ඇත. මෙය ව්‍යුහාත්මක අවදානම් පාලන ක්‍රමවේදයකට පහසුකම් සපයන අතර, ව්‍යාපාරයේ සෑම අංශයකම අවදානම් ඇතිවීමට පෙර හඳුනාගත හැකි සංස්කෘතියක් (Risk aware culture) ඇති කරමින් ප්‍රමාණවත් අවදානම් ඇගයීම, හඳුනාගැනීම සහ අවමකිරීම සහතික කරනු ඇත.

1. **අවදානම් හඳුනාගැනීම**

   අවදානම් හඳුනාගැනීමේ පරමාර්ථය වන්නේ ආයතනයක අරමුණු සාක්ෂාත් කරගැනීමට උපකාරී වන හෝ වළක්වා වන/බාධා ඇති කරවන අවදානම් සොයාගැනීම, හඳුනා ගැනීම සහ විස්තර කිරීමයි. අවදානම් හඳුනාගැනීමේ දී ව්‍යාපාරයට අදාළ, සුදුසු සහ යාවත්කාලීන තොරතුරු වැදගත් වන අතර, අරමුණු එකකට හෝ වැඩි ගණනකට බලපාන අවිනිශ්චිතතාවයන් හඳුනාගැනීම සඳහා ආයතනයකට විවිධ වූ ක්‍රමවේදයන් භාවිතා කළ හැකිය.

2. **අවදානම් විශ්ලේෂණය**

   අවදානම් විශ්ලේෂණයේ මූලික පරමාර්ථය වනුයේ අවදානමේ ස්වභාවය හා සුදුසු අවස්ථාවන්හිදී අවදානමෙහි බලපෑමේ ප්‍රමාණය ඇතුළු ලක්ෂණ අවබෝධ කර ගැනීම වන අතර, අවදානම් විශ්ලේෂණයට, අවිනිශ්චිතතාවයන්, අවදානම් ප්‍රභවයන්, ප්‍රතිවිපාක, සම්භාවිතාව, සිදුවීම්, අවස්ථා, පාලනයන් සහ ඒවායේ කාර්යක්ෂමතාව පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් ඇතුළත් වේ. තොරතුරුවල විවිධ බව, සංකීර්ණතාව, විශ්ලේෂණයේ අරමුණ මත පදනම්ව, තොරතුරු ලබාගැනීමේ හැකියාව

සහ විශ්වසනීයත්වය හා පවතින සම්පත් මත විශ්ලේෂණය සිදුකළ හැකිය. අවස්ථාව හෝ වාතාවරණය මත හා අපේක්ෂාව මත විශ්ලේෂණ ශිල්පීය ක්‍රම ගුණාත්මක, ප්‍රමාණාත්මක හෝ මෙහි සංයෝජනයක් විය හැකිය.

3. **අවදානම් ඇගැයීම**

තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සහයෝගය ලබාදීම, අවදානම් ඇගැයීමේ මූලික අරමුණ ලෙස හැඳින්විය හැක. අවදානම් විශ්ලේෂණයේ ප්‍රතිඵල ස්ථාපිත අවදානම් නිර්ණායක සමඟ සංසන්දනය කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මත අවදානම් කළමනාකරණය සඳහා අමතර ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව හඳුනාගැනීම අවදානම් ඇගයීමේ ක්‍රියාවලියට ඇතුළත් වේ. එම තීරණ පහත පරිදි විය හැක.


- කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම.
- අවදානම් සඳහා ප්‍රතිකාර ක්‍රම සළකාබැලීම.
- අවදානමෙහි බලපෑම තවදුරටත් අවබෝධ කරගැනීම සඳහා වැඩිදුර විශ්ලේෂණය.
- පවත්නා පාලනයන් පවත්වාගෙන යාම.
- අරමුණු නැවත සළකාබැලීම.

4. **අවදානම් ප්‍රතිකාර**

අවදානම් ප්‍රතිකාර ක්‍රියාවලියෙහි පරමාර්ථය වන්නේ අවදානම විසඳීම සඳහා විකල්ප විසඳුම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම වේ. එහි පහත පරිදි පුනරාවර්තන ක්‍රියාවලියක් ඇතුළත් වේ.

- අවදානම් ප්‍රතිකාර සඳහා විකල්ප විසඳුම් සකස් කිරීම සහ තෝරාගැනීම.
- තෝරාගත් විකල්පය සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ක්‍රියාත්මක කරන ලද ප්‍රතිකාරයේ ඵලදායීතාවය තක්සේරු කිරීම.
- ඉතිරිව පවතින අවදානමෙහි බලපෑම ආයතනයකට පිළිගත හැකි ද යන්න තීරණය කිරීම.
- පිළිගත නොහැකි නම්, තවදුරටත් ප්‍රතිකාර ක්‍රම ක්‍රියාත්මක කිරීම.

අවදානම් තාප සිතියම **(Risk Heat Map)**



අවදානම් නිරාවරණය	අරමුණු	අවදානම් අවමකිරීමේ උපායමාර්ග
මූල්‍ය අවදානම් කළමනාකරණය		
1. ද්‍රවශීලතාවය සහ මුදල් කළමනාකරණය.	වෙළෙඳපොළ අවස්ථාවන්ට වේගවත් ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා ක්ෂණික අරමුදල් සැපයීමේ හැකියාව තහවුරු කිරීම.	දිගු කාලීන ණය මඟින් දිගුකාලීන වත්කම් සඳහා අරමුදල් සැපයීම.
	සෑම විටම “ප්‍රමාණවත්” ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීම.	සෑම විටම සංස්ථාවට කෙටි කාලීන ණය ගැනීමේ පහසුකම් ලබාගැනීම.
		වියදම් පාලනය සඳහා මුදල් බලතල වටිනාකම මත බෙදා ඇත.
		අනාගත අරමුදල් අවශ්‍යතා සඳහා ඇපකරයක් ලෙස ඉදිරිපත් කළ හැකි පොත් වටිනාකම්වලට වඩා සැළකිය යුතු ලෙස වෙළෙඳපොළ වටිනාකම් සහිත ඉඩම් සහ ගොඩනැඟිලි සංස්ථාව සතුව ඇත.
		විවිධ මූල්‍ය ආයතන හරහා අරමුදල් අවශ්‍යතා සපුරාගැනීම.
2. පොළී අනුපාත අවදානම	පොළී අනුපාත අස්ථාවරත්වයේ අහිතකර බලපෑම් අවම කිරීම.	සංස්ථාවේ ආයෝජන සඳහා හැකි උපරිම පොළී අනුපාතය ලබාගැනීම සඳහා බැංකු සමඟ සාකච්ඡා කිරීම.
	ණයගැනීමේ පිරිවැය අවම මට්ටමක පවතින බව සහතික කිරීම.	ඉහළ පිරිවැය අවම කිරීම සහ දේශීය පොළී අනුපාතවල අහිතකර උච්චාවචනයන් වළක්වා ගැනීම සඳහා සැපයුම්කරුවන්ගේ ණය ලබාගැනීම හා සාකච්ඡා කිරීම.
	කොටස් මත ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම.	අඩු gearing අනුපාතයක් පවත්වා ගැනීම සහ ඵලදායී කාරක ප්‍රග්ධන කළමනාකරණය.
ව්‍යාපාර අවදානම් කළමනාකරණය		
3. ණය අවදානම	ණය ගැතියන් ණය පැහැර හැරීම් ආශ්‍රිත අවදානම් අවම කිරීම.	ණය ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
		සියලුම ප්‍රධාන ගනුදෙනුකරුවන් සඳහා බැංකු ඇපකර, තැන්පතු සහ ඇපකරය ලබාගැනීම.
		ණය ලබාදීමට පෙර ගනුදෙනුකරුවන්ගේ ණය ලබාදීමේ සුදුසුකම් සහතික කිරීම සඳහා දැඩි තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.
		ණයගැතියාගේ ශේෂයන්සමීපව අධීක්ෂණය කිරීම, ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීම සහ එම ක්‍රියාකාරී සැළසුම් අපේක්ෂිත අන්දමින් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම.

4. වත්කම් අවදානම	ගින්නෙන්, සොරකමින් සහ යන්ත්‍රෝපකරණ බිඳවැටීමේ අවදානම අවම කිරීම.	සියලුම සපෘශ්‍ය වත්කම් සඳහා පුළුල් රක්ෂණ ආවරණ ලබාගැනීම.
		අනිවාර්ය වැළැක්වීමේ නඩත්තු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
		ගිනි නිවීම වැනි ක්ෂේත්‍රවල නිරත සේවකයන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
5. අභ්‍යන්තර පාලනයන් හා බැඳි අවදානම	සංස්ථා වත්කම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගැනීම.	පද්ධති විගණනය, තොග සහ මුදල් ගණනය කිරීම් ඇතුළු සියලුම විගණන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන පාලන යාන්ත්‍රණයන් සිදුකිරීම.
		සංස්ථාවේ කාර්යසාධනය එහි ඉලක්කවලට අනුකූල බව සහතික කිරීම සඳහා අයවැය ක්‍රියාවලියක් සහ අයවැය පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.
6. කීර්ති නාමය හා බැඳි අවදානම	කීර්ති නාමයට හානි පමුණුවන හේතූන් ඇතිවීම වැළැක්වීම.	නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අඛණ්ඩ පුහුණුව, තත්ත්ව කළමනාකරණය සහ සහතික කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
	අපගේ ක්‍රියාපටිපාටියෙන් බැහැරව කීර්ති නාමය පිළිබඳ අර්බුදයක් ඇති වුවහොත් එහි බලපෑම අවම කිරීම.	නිරතුරුව අභ්‍යන්තර හා බාහිර තත්ත්ව පරීක්ෂා සිදුකිරීම.
		නිෂ්පාදන පහසුකම් සඳහා අඛණ්ඩ ආයෝජන හා වැඩිදියුණු කිරීමේ පියවරයන් ගැනීම.
		බාහිර තත්ත්ව පාලන ආයතන මඟින් සහතික ලබා ගැනීම.
		ප්‍රමිතිගත නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපනය.
7. මානව ප්‍රාග්ධනය හා කම්කරු අවදානම	බාධාවකින් තොරව අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාවලිය සහතික කිරීම.	දිරි දීමනා සහ සුභසාධක කටයුතු මඟින් සේවක ප්‍රතිලාභ පුළුල් කිරීම.
	මානව සේවායෝජකයෙකු ලෙස අපව ප්‍රක්ෂේපණය කිරීම, අභිප්‍රේරණ කටයුතු සාර්ථකව ඉටුකිරීම, සංවර්ධනය කිරීම, රඳවාගැනීම සහ ගුණාත්මක සේවක ප්‍රාග්ධනයක් ආකර්ෂණය කරගැනීම.	සේවක බඳවාගැනීම්, කාර්යසාධන ඇගැයීම් සහ අභ්‍යන්තර මෙන්ම බාහිර පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් මානව සම්පත් අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම.
		කාර්ය සාධනය මත පදනම් වූ සංස්කෘතියක් සංස්ථාව තුළ ප්‍රවර්ධනය කිරීම.
8. තාක්ෂණික අවදානම	වර්තමාන තාක්ෂණික වර්ධනයන්ට අනුගතවීම සහ යල්පැණයාම වැළැක්වීම.	නව තාක්ෂණයන් සහ ස්වයංක්‍රීයකරණය සඳහා අඛණ්ඩ ආයෝජනය.
		වර්ෂය පුරා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීම.

9. වෙළෙඳපොළ තරඟකාරිත්ව අවදානම	අපගේ වෙළෙඳපොළ කොටස උපරිම කිරීම.	ඉහළ ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම.
	මූලික නිෂ්පාදනවලින් ජනනයවන ආදායම ඉහළ නැංවීම.	මිලගණන්වල තරඟකාරී බව සහතික කිරීම සඳහා නිෂ්පාදන ඵලදායීතාව සහ කාර්‍යක්ෂමතාව වැඩිකිරීම.
		අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෙළෙඳපොළ පර්යේෂණ සිදුකිරීම.
		වෙළෙඳ ප්‍රචාරණ සහ ඉලක්ක අලෙවිකරණය තුළින් සංස්ථා සන්නාමය තවදුරටත් ශක්තිමත් කිරීම.
		ප්‍රදර්ශනාගාරවල පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ වැඩසටහන් ස්ථාපනය.
10. පාරිසරික, දේශපාලනික සහ නියාමන අවදානම	අපගේ පාලනයෙන් බැහැරව ඇති බාහිර පරිසරයේ ඇති වන විචලනයන්ගෙන් ඇති විය හැකි ඍණාත්මක බලපෑම අවම කිරීම.	අදාල බලධාරීන් විසින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලවීම සහ අනුකූලතාවය සහතික කිරීම.
	නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවීම.	ව්‍යවස්ථාපිත හා නියාමන ආයතනවල අවශ්‍යතාවයන්ට අනුකූලවීම.



ආයතනික සමාජ වගකීම

වගකීමෙන් යුතු රාජ්‍ය ආයතනයක් ලෙස, සියලුම බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ගේ වර්තමාන හා අනාගත පැවැත්ම අපගේ පැවැත්මට ද අත්‍යවශ්‍ය සාධකයක් බව අපගේ විශ්වාසයයි. ඒ අනුව දූව ව්‍යාපාරය තවදුරටත් වගකීමෙන් හා තිරසාර බැවින් වැඩිදියුණු කරමින් ආර්ථිකමය වශයෙන් දියුණුවක් ළඟා කරගැනීම සඳහා නව ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම අපගේ අරමුණ වේ.



පැළ බෙදාදීම සහ රුක් රෝපණ වැඩසටහන් සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශික 14ක් තුල පවත්වාගෙන යන පැල තවාන් 28ක් හරහා වටිනා දැවමය සහ අනෙකුත් විශේෂවල පැළ නිෂ්පාදනය කරනු ලබන අතර පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත නොමිලයේ පැළ බෙදා දෙනු ලැබේ. රුක් රෝපණ වැඩසටහන් තුලින් දැව විශේෂ ප්‍රචලිත කිරීම හරහා දේශීය දැව කර්මාන්තය තිරසාර කිරීමට සහ ජෛව විවිධත්වය වැඩි දියුණු කිරීමට රාජ්‍ය දැව සංස්ථාව අපේක්ෂා කරයි. තවද, ශාක ප්‍රජාවන් ආශ්‍රිත කාබන් සංචිත වැඩිදියුණු කිරීම තුලින් දේශගුණික විපර්යාසවලට විසඳුම් සෙවීම, දිවයිනේ වන ආවරණය වැඩි කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම, මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණු වේ. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වල අපගේ වපසරිය වන තිරසාර දැව කර්මාන්තය මත පදනම් වූ දැව (ද්‍රව්‍ය) පරිභෝජනය වැඩි කිරීම, අධ්‍යාපනික වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීම ආදිය කෙරෙහි රාජ්‍ය දැව සංස්ථාව අවධානය යොමු කර ඇති අතර පැළ නිෂ්පාදනය හා රුක් රෝපණ වැඩසටහන් සඳහා අනුග්‍රහ දැක්වීම තුළින් පරිසර සංරක්ෂණය සම්බන්ධ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා රටට සහය ලබා දීමද සිදු කරනු ලැබේ.

2023 වර්ෂයේදී විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා පැළ 39,226 ක් බෙදා දී ඇති අතර 2023 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවේ තවාන් මගින් පැළ 37,500 ක් නිෂ්පාදනය කර ඇත. පැළ බෙදා හැරීමේ විශේෂ අවස්ථා පහත සඳහන් වේ.

- පරිසර ආරක්ෂණ ඒකකය, ශ්‍රී ලංකා පොලිසිය - පැළ 12500
- මධ්‍යම පරිසර අධිකාරිය - පැළ 5000
- වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය - පැළ 2000
- ශ්‍රී ලංකා කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතිය (SLTCP) - පැළ 3000
- දේවගිරි රජමහා විහාරය, බිංගිරිය - පැළ 2000
- ගුරුමඩල කනිෂ්ඨ පාසල (බණ්ඩාරවෙල) - පැළ 1000
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (මාදම්පාගම)- පැළ 500





75 වැනි නිදහස් දින සැමරුම වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසියේ පරිසර ආරක්ෂණ කොට්ඨාශය සඳහා පැළ පරිත්‍යාග කිරීම





ගොවීන් සඳහා පැළ පරිත්‍යාග කිරීම

“The Little Forester Program” - පුංචි වන විද්‍යාඥයා - 2023

වන සම්පත් තිරසාර කළමනාකරණය ලොව පුරා උණුසුම් මාතෘකාවක් වේ. ශ්‍රී ලාංකීය ප්‍රජාව පරිසර ආරක්ෂණය පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වන නමුත්, තිරසාර සංකල්ප හොඳින් අවබෝධ කරගෙන නොමැත. එබැවින්, අඛණ්ඩ අධීක්ෂණයක් සහිතව "තිරසාර" සංකල්ප තේමාකර ගනිමින් වඩාත් ඵලදායී වැඩසටහනක් සංවිධානය කිරීම අත්‍යවශ්‍ය වේ.

රාජ්‍ය දැව සංස්ථාව සහ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) B අංශය (කෘෂිකර්ම හා වන විද්‍යා) හා එක්ව "The Little Forester Program 2023” සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ද මෙම වැඩසටහනට සහාය විය. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි කණ්ඩායම වන්නේ පාසල් සිසුන් බවට හඳුනා ගත් අතර ඒ අනුව එම සිසුන් ඉලක්ක කර රුක් රෝපණය, ඒවායේ නඩත්තුව හා ඒ සම්බන්ධ වාර්තා පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙන ලදී.

වතුපිටිවල - යටියන කනිෂ්ඨ විද්‍යාලයේ "The Little Forester Program 2023"

2023 වසරේ මෙම වැඩසටහන වතුපිටිවල යටියන කනිෂ්ඨ විද්‍යාලයෙන් දියත් කරන ලදී. රුක් රෝපණ ක්‍රියාකාරකම් හැර, රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රකාශන එකතුවක් (තිරසාර වන කළමනාකරණය, ජෛව විවිධත්වය, ආශ්චර්යමත් දැව නිර්මාණ, විවිධ ගස් විශේෂ පිළිබඳ පත්‍රිකා) පාසලට පරිත්‍යාග කරන ලදී. පාසල් සිසුන් විසින් රෝපණය කරන ලද පැළ අවම වශයෙන් මාස හයක්වත් පවත්වා ගෙන යාමේ වගකීම පැවරී ඇති අතර සියලුම නඩත්තු කිරීම්/ නිරීක්ෂණ සපයා ඇති ක්ෂේත්‍ර අත්පොතෙහි සටහන් කිරීමට කටයුතු කර ඇත.




වතුපිටිවෙල යටියන කනිෂ්ඨ විද්‍යාලයේ "The Little Forester" වැඩසටහන ආරම්භ කිරීම

අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු

විවිධ පුහුණු වැඩසටහන් හරහා සේවකයින්ගේ නිපුණත්වය වර්ධනය කිරීමට රාජ්‍ය දැව සංස්ථාව උපරිම උත්සාහය දරයි. දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) යනු සංස්ථාවේ පුහුණු ආයතනය වන අතර එය විශාල වපසරියක පුහුණුවීම් සපයයි. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) යටතේ දැව තාක්ෂණ පුහුණු ආයතනය ලියාපදිංචි කර ඇත (ලියාපදිංචි අංක P01/0365).

පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	ඉලක්කගත කාණ්ඩය	සේවක සංඛ්‍යාව
දැව ඔප දැමීම	01	දැව ඔප දමන්නන් / නිෂ්පාදන සහායකයින් / නිෂ්පාදන අංශයේ කළමනාකරු	29
2023 අයවැය මත මෑතකාලීන බදු වෙනස් වීම	01	මුදල් අංශයේ නිලධාරීන්	03
ප්‍රවාහන කළමනාකරණය	01	ප්‍රවාහන අංශයේ නිලධාරීන්	04
Advance Excel	01	මුදල් අංශයේ නිලධාරීන්	04
විමර්ශනය	01	විමර්ශන අංශයේ නිලධාරීන්	02
Microsoft Azro A2 900 Az 104	01	තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන්	01

පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	ඉලක්කගත කාණ්ඩය	සේවක සංඛ්‍යාව
Forest Inventory	01	ප්‍රාදේශිය කළමනාකරුවන්	10
Chainsaw පුහුණුව	03	දම්වැල් කියත් ක්‍රියාකරුවන්, සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්, වැඩබිම් නිලධාරීන්, කලාපවල ක්ෂේත්‍ර සහයකයින්	145
ඩිජිටල් අලෙවිකරණය සහ වෙබ් නිර්මාණය	01	තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන්	01
ඵලදායිතාව සහ අභිප්‍රේරණය	01	බූස්ස සංකීර්ණයේ සේවකයන්	98
විදුලි අළුත්වැඩියා කිරීම සහ විදුලි රැහැන් නඩත්තු කිරීම	01	විදුලි කාර්මිකයින්	03
Certificate in Advanced MS Office 2021	01	කළමනාකාර(මුදල්)	01
අභ්‍යන්තර විගණනය	01	අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන්	23
Auto Electronics & programming	01	ඉංජිනේරු සහකාර සහ කාර්මික ශිල්පීන්	05
බොයිලේරු ක්‍රියාවලිය	01	බොයිලේරු ක්‍රියාකරු	02
අපනයන ක්‍රියාපටිපාටිය	01	සහකාර කළමනාකාර	01
වෘත්තීය සෞඛ්‍ය සහ කාර්මික ආරක්ෂාව	01	නියෝජ්‍ය කළමනාකාර	01
පුද්ගලික ගොනු පරිහරණය	01	කළමනාකරණ සහකාරවරුන්	56
අලෙවි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	01	නිෂ්පාදන සහකාරවරු	01
දත්ත විශ්ලේෂණය සඳහා MS Excel භාවිතය	01	විවිධ තනතුරු වල නිලධාරීන්	07
කර්මාන්තශාලා සඳහා ERP	01	සහකාර කළමනාකරුවන්/ කළමනාකරණ සහකාරවරුන්	07
දුරකථන කුසලතා සහ පුහුණු ආචාර විධි	01	දුරකථන ක්‍රියාකරුවන්	01
NVQ අදාල පුහුණු	01	වඩු කාර්මිකයන්	27
ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ සහතික පාඨමාලාව	01	නියෝජ්‍ය කළමනාකරු	01
ආදායම් බදු ගණනය කිරීම	01	මුදල් අංශයේ නිලධාරීන්	02
MS සමඟ ව්‍යාපාර විශ්ලේෂණය	01	මුදල් අංශයේ නිලධාරීන්	02

පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	ඉලක්කගත කාණ්ඩය	සේවක සංඛ්‍යාව
දෙමළ භාෂා ප්‍රවීණතාවය	06	විධායක සහ විධායක නොවන නිලධාරීන්ගේ විවිධ තනතුරු	300
ප්‍රායෝගික ව්‍යාපෘති වැඩමුළුව	01	කළමනාකරු(තොරතුරු තාක්ෂණ)	01
Aws cloud practitioner සහ Architect Associate	01	තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන්	03
සයිබර් ආරක්ෂාව	02	විධායක සහ විධායක නොවන නිලධාරීන්ගේ විවිධ තනතුරු	244
තොග කළමනාකරණය	01	කළමනාකරණ සහකාරවරුන්	50
විද්‍යාත්මක හා ඵලදායී රිය පැදවීම	01	රියදුරන්	08
පශ්චාත් උපාධි/උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ සහතික (සේවකයන්ගේ පුද්ගලික ඉල්ලීම් මත පදනම්ව බාහිර ආයතන විසින් සපයනු ලැබේ)	11	විවිධ තනතුරු	11
එකතුව	**51**		**1054**

2023 වර්ෂයේ මුළු පුහුණු වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව - 51

මුළු සේවක සංඛ්‍යාව **- 1054**

වැය කළ මුදල **- Rs.2,837,557/=**



අභ්‍යන්තර විගණන වැඩමුළුව



දෙමළ භාෂා ප්‍රවීණතා වැඩමුළුව

බාහිර පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ තොරතුරු

රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය හා පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වී දැව හා වන වගාව ආශ්‍රිත විෂයයන් පිළිබඳව දැනුවත් කිරීමේ කාර්යන් වල නියැලේ. දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) බාහිර පුහුණු වැඩසටහන් සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. බාහිර පාර්ශ්වයන් සඳහා ලබා දී ඇති පුහුණු අවස්ථා පහත පරිදි වේ.

ආයතනය	සිසුන් / සේවක ගණන
රණවිරු සම්පත් කේන්ද්‍රය	21
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - සිසුන්	103
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	37
ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුර - නාවික හා සාගරික විද්‍යාපීඨය	25
ජාතික පොලිස් අභ්‍යාස ආයතනය	01
මොරටුව විශ්වවිද්‍යාලය - වාස්තු විද්‍යාපීඨය	50
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය	19
රාජ්‍ය දැව සංස්ථාව (බණ්ඩාරවෙල) - විපුල ශාන්ත මයා	01
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - ගම්පහ	25
ශාක විද්‍යා දෙපාර්තමේන්තුව - රජරට විශ්වවිද්‍යාලය	39
රුහුණු විශ්වවිද්‍යාලය - තාක්ෂණ පීඨය	15
රණවිරු සම්පත් කේන්ද්‍රය	40
කාර්මික සංවර්ධන දෙපාර්තමේන්තුව - වයඹ පළාත	06
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය	06
රුහුණු විශ්වවිද්‍යාලය - කෘෂි විද්‍යාපීඨය	29
ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනය	55
එකතුව	**472**





ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා දැව සංරක්ෂණය සහ
දැව තාක්ෂණය පිළිබඳ පුහුණුව - කැප්පෙටිපොළ





ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා දැව හඳුනාගැනීම පිළිබඳ පුහුණුව

NVQ ඇගයීම් සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාවෙහි දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ සම්බන්ධ වී වඩු කාර්මිකයන් සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා වන අවසාන පරීක්ෂණවල NVQ මට්ටම් 3 සහ 4 අවසන් ඇගයීම් සිදු කර ඇත. අවසාන පරීක්ෂණ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, මෙවලම් සහ උපකරණ සහ පුහුණු ස්ථානය ලබා දීමෙන් NAITA විසින් නම් කරන ලද සිසුන්ට සහ විභාග අධීක්ෂකවරුන්ට පහසුකම් සපයනු ලැබේ. 2023 දී සිසුන් 107 දෙනෙකු ඇගයීමට ලක් කරන ලදී.

2023 දී දැව ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයන කටයුතු

පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය විසින් දැව ආශ්‍රිත පර්යේෂණ කිහිපයක් සිදු කරන ලද අතර ඒවා සඟරා සහ සම්මන්ත්‍රණ සාරාංශ සහ අන්තර්ජාතික සම්මන්ත්‍රණවල පර්යේෂණ ලිපි ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම අධ්‍යයනයන්හි සොයා ගැනීම් දැව හා වන විද්‍යාව පිළිබඳ සිසුන්ට සහ පර්යේෂකයන්ට මෙන්ම රාජ්‍ය දැව සංස්ථාවේ ක්ෂේත්‍ර යෙදුම්වල භාවිතයන් සඳහා ඉතා වැදගත් වේ.

පහත දැක්වෙන්නේ ප්‍රකාශිත අධ්‍යයනයන් ය.

ජර්නල් පර්යේෂණ පත්‍රිකා

C.K. Muthumala, Sudhira De Silva, K. K. I. U. Arunakumara and P.L. A. G. Alwis 2023.Assessment of the Shear Failure Modes of Softwood and Hardwood Timber under Different Wood Joints, J Fail. *Anal. andPreven.* Springer, https://doi.org/10.1007/s11668-023-01672-1

C.K. Muthumala, K.K.I.U. Arunakumara, Sudhira, DevSiva, P.L.A.G. Alwis, and M.J.P. Dayawansha. 2023. Shrink Index-Based Timber Classification and Finger Joint Production, *ICSBE2022-LNCE* 362, Springer nature. pte, ltd. Singapore. pp. 319-331. https://doi.org/10.1007/978-981-99-3471-3_23

C.K. Muthumala. 2023. Evaluation of the dimensional effect and relationship between density and shrinkage of Sri Lankan grown timber species , International Symposium on Agriculture and Environment 2023, University of Ruhuna, Sri Lanka, p.112.

Arachchi C. I. M., Muthumala C. K. and Jayalath J. A. C. S. 2023. Preliminary Investigation on the Effect of Termites on Wood Decay in Selected Sri Lankan Timber species, *Proceedings of the* 27th *International Forestry & Environmental Symposium-USJP. p.122*

W. V. T. D. Amarasinghe and C. K. Muthumala, 2023. Degradation of wood quality of *Eucalyptus grandis* logs exposed to the natural environment, *International Conference on Building Resilience In Tropical Agro Ecosystems,* Sri Lanka.

Muthumala C.K, Arunakumara K.K.I.U. 2023. A Key to Identify Woods of Different Eucalyptus Species, International Conference on Building Resilience In Tropical Agro Ecosystems, Sri Lanka.

Rasika S. Brahmanage, Nalin N. Wijayawardene, Chandrika M. Nanayakkara, Chaminda K. Muthumala, Siril Wijesundara, Dong Q. Dai1,& Kahandawa G.S.U, Ariyawansa, Eucalyptus leaf spot disease caused by *Coniellaeucalyptorum* in Sri Lanka, Phytotaxa, ISSN 1179-3155 (print edition), https://doi.org/10.11646/phytotaxa.

ප්‍රදර්ශන සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාව සක්‍රීයව දැව සහ වාණිජ වන වගා තිරසාර භාවිතය ප්‍රචලිත කිරීමෙහි නිරත විය. බැවින් රාජ්‍ය දැව සංස්ථාව ප්‍රදර්ශන සඳහා සහභාගී වීම තුළින් මහජනතාවගේ දැනුම වැඩි දියුණු කිරීම අපේක්ෂා කරයි.

1. D.S. සේනානායක විද්‍යාලය - මීරිගම - 2023.03.03 සිට 2023.03.05 දක්වා
2. ශ්‍රී ලංකා පදනම - 2023.01.10
3. ලෝක ළමා දිනය වෙනුවෙන් පින්නවල සත්වෝද්‍යානය - 2023.09.28 සිට 2023.10.01 දක්වා
4. ජාතික විද්‍යා දිනය - ජාතික කෞතුකාගාරය - 2023.11.08 සිට 2023.11.10



ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ප්‍රදර්ශනය

ජාතික විද්‍යා දිනය සැමරීම - අධ්‍යාපන අමාත්‍යාංශය

2023 නොවැම්බර් 08 සිට 10 දක්වා ජාතික විද්‍යා දිනය සැමරීම නිමිත්තෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික කෞතුකාගාරයේදී පවත්වන ලද ප්‍රදර්ශනය සඳහා රාජ්‍ය දැව සංස්ථාව සක්‍රීයව සහභාගී විය. රාජ්‍ය දැව සංස්ථාව තේමා තුනක් යටතේ ප්‍රදර්ශන කුටිය ඉදිරිපත් කරන ලදී. තිරසාර වන කළමනාකරණය, තිරසාර දැව භාවිතය සහ දැව සහ දේශගුණික විපර්යාස. මෙම තේමා යටතේ වාණිජ වන කළමනාකරණය, දැව සංරක්ෂණ ශිල්පීය ක්‍රම, දැව ශ්‍රේණිගත කිරීම සහ දැව හඳුනාගැනීම, දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීමේදී දැවවල වැදගත්කම හඳුන්වා දෙන ලදී. පයින් දැව සහ දේශීය දැව භාවිතය සහ කාබන් තිර කිරීම පිළිබඳ එහි වැදගත්කම නිදර්ශක සහ අලුතින් සාදන ලද ගෘහ භාණ්ඩ මගින් ද ඉදිරිපත් කරන ලදී. රාජ්‍ය දැව සංස්ථාව එහි ආකර්ශනීය සහ ප්‍රබෝධමත් ප්‍රදර්ශන කුටිය ලෙස අගය කරන ලද අතර ඒ සඳහා සහතික ද හිමි විය.





ජාතික විද්‍යා දිනය සමරමින් ජාතික කෞතුකාගාරයේ පැවති ප්‍රදර්ශනය



CERTIFICATE

NATIONAL SCIENCE DAY 2023

This certificate is awarded to

State Timber Corporation
STC

For presenting attractive & inspiring gallery
at the Science Exposition on Commemorating
for
National Science Exposition 2023
Organized by the
Ministry of Education
Research and Innovation Division
held on 08th, 9th & 10th November 2023
at
Department of National Museums
Colombo 07

M. N. Ranasinghe
Secretary
Ministry of Education

බාහිර පාර්ශ්ව සඳහා තාක්ෂණික සහාය සැපයීම

දැව සම්බන්ධ ගැටළු විසඳීම සඳහා පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය බාහිර ආයතන සඳහා තාක්ෂණික සහාය සපයයි. උදාහරණයක් ලෙස ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ලී භාණ්ඩ සඳහා පිරිවිතර සැකසීම, දැව භාවිතය පිළිබඳ උපදේශන යනාදිය වේ. මේ අනුව 2023 දී රාජ්‍ය දැව සංස්ථාව පහත ආයතනවල වැඩසටහන් සඳහා සහාය විය.

1. උණ බම්බු පරිරක්ෂණය ආශ්‍රිත තාක්ෂණ දැණුම හුවමාරු වැඩමුළුව - කාර්මික සංවර්ධන මණ්ඩලය

2. දැව ශිල්පීන්ගේ ගෘහ භාණ්ඩ සඳහා වැඩමුළු කිහිපයක් පැවැත්වීම - NAITA මාර්ගෝපදේශ පොත් සකස් කිරීම

3. සම්මත කොහු කෙඳි යොදා දූව කොසු සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට තාක්ෂණිකව සහාය දැක්වීම.

4. කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ජාතික තිරසාර ජෛව ස්කන්ධ සංවර්ධන මූලාශ්‍ර පිළිබඳ වැඩසටහනට සහභාගි වීම.

5. ශ්‍රී ලංකා පාරිසරික වෘත්තිකයන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද දැව තාක්ෂණ පුහුණු වැඩමුළුවට දායක වීම.

6. විශ්වවිද්‍යාල, වන විද්‍යාලය, කාර්මික විද්‍යාලය සහ අනෙකුත් ආයතන සඳහා දැව තාක්ෂණ දේශන පැවැත්වීම.





ශ්‍රී ලංකා පාරිසරික වෘත්තිකයන්ගේ ආයතනයේ කාර්මික සම්බන්ධතා කමිටුව විසින් සංවිධානය කරන ලද දැව සංසද පාර්ශවකරුවෙකු ලෙස දායකත්වය සැපයීම





කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගයෙන් උණ බම්බු පරිරක්ෂණය පිළිබඳ තාක්ෂණ දැනුම හුවමාරු වැඩමුළුව


දැව හඳුනා ගැනීම සහ දැව වාර්තා නිකුත් කිරීම


ව්‍යුහ විද්‍යාත්මක ලක්ෂණ තුළින් දැව හඳුනාගැනීම සඳහා දැව ව්‍යුහ විද්‍යාව භාවිත කිරීමට පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය නවීන තාක්ෂණය භාවිත කරයි. මෙම ක්‍රියාවලිය යටතේ වාර්ෂිකව දැව හඳුනාගැනීමේ සහතික සහ අනෙකුත් වාර්තා 150-200ක් පමණ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වෙත නිකුත් කෙරේ. දැව හඳුනා ගැනීමට අමතරව, MOR, MOE, සම්පීඩන පරීක්ෂණය, ඝනත්ව පරීක්ෂණ සහ දැව සංරක්ෂණ පරීක්ෂණ (Boron, CCB) සහ ශක්ති ගුණාංග පරීක්ෂණ සිදු කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේදී පහත වාර්තා නිකුත් කර ඇත. පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව 174 ක් වූ අතර 2023 වසරේ නිකුත් කළ මුළු වාර්තා සංඛ්‍යාව 214 කි.

වාර්තා විස්තරය	වාර්තා ගණන
දැව හඳුනා ගැනීම	100
දැව තෙතමනය පරීක්ෂා කිරීම	29
දැව ඝනත්ව පරීක්ෂණය	13
බෝරෝන් පරීක්ෂණය	08
CCB පරීක්ෂණය	02
ACQ පරීක්ෂණය	05
දැවවල ශක්ති ගුණාංග	17
වෙනත් (තාක්ෂණ වර්තා සහ ක්ෂේත්‍ර චාරිකා මගින්	**40**
එකතුව	**214**


ව්‍යාපාර සාරාංශය


ආදායම් වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය






ලාභ වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය











ව්‍යාපාර සාරාංශය


නිෂ්පාදන ප්‍රවර්ධන ප්‍රවණතා විශ්ලේෂණ














ප්‍රාග්ධන වියදම් - 2023

විස්තරය (රු මිලියන 2ට වඩා වැඩි)	Rs.
දම්වැල් කියත් - ප්‍රාදේශික	31.1
පරිගණක සහ මුද්‍රණයන්ත්‍ර	8.6

ආයෝජන

	31-12-2023	31-12-2022
රජයේ ආයතනවල තාවකාලික අතිරික්ත අරමුදල් ගිණුම	731,832,197	731,832,197
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	46,821,808	241.353,882
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	500,000	500,000
මහජන බැංකුව	2,188,897	1,900,333,483
ලංකා බැංකුව	1,871,445	1,805,915,239

දශකයක තොරතුරු (නිරපේක්ෂ අගයන්)

		2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
මුළු වාර්ෂික ආදායම	රු '000	3,756,482	4,132,052	4,522,238	4,630,718	4,457,024	4,608,413	4,372,033	5,996,789	5,465,421	5,147,304
වාර්ෂික දළ ලාභය	රු '000	1,453,450	1,757,115	2,045,090	2,075,950	1,964,647	1,890,812	1,745,766	2,753,682	2,290,975	1,908,909
පොලී සහ බදු වලට පෙර ශුද්ධ ලාභය	රු '000	427,222	768,699	659,732	966,804	672,433	512,947	569,521	1,496,156	1,015,986	1,273,734
මුළු සේවක පිරිවැය	රු '000	1,254,516	1,449,749	1,789,572	1,572,775	1,553,598	1,584,418	1,640,020	1,580,855	1,776,363	1,774,507
වාර්ෂික ප්‍රාග්ධන වියදම්	රු '000	115,132	244,929	113,675	94,637	116,034	319,485	104,712	126,547	47,998	55,085
වර්ෂාවසාන දිනට ජංගම නොවන වත්කම්	රු '000	1,654,908	1,743,580	1,732,640	1,894,597	1,978,855	2,581,165	1,966,637	2,158,971	2,391,511	2,050,668
වර්ෂාවසාන දිනට ජංගම වත්කම්	රු '000	4,004,860	4,115,259	3,652,116	4,423,105	4,541,610	4,640,889	5,319,557	7,048,847	7,196,775	7,512,262
වර්ෂාවසාන දිනට ජංගම වගකීම්	රු '000	1,591,991	1,480,966	897,087	1,234,716	1,047,668	967,481	985,365	1,791,411	1,423,068	972,510
වර්ෂාවසාන දිනට ජංගම නොවන වගකීම්	රු '000	484,649	424,854	499,373	852,292	812,441	714,022	836,197	659,200	500,063	583,632
වර්ෂාවසාන දිනට හිමිකම්	රු '000	3,583,129	3,953,019	3,988,297	4,230,694	4,660,357	5,540,551	5,464,633	6,757,207	7,665,155	8,006,788
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	රු '000	25,000	50,000	175,000	100,000	100,000	50,000	511,026	100,000	320,000	649,461
වර්ෂාවසාන දිනට සේවක සංඛ්‍යාව	NOS.	2,186	2,145	2,125	2,083	2,001	1,803	1,708	1,606	1,500	1,390
ප්‍රධාන කාර්ය සාධන දර්ශක											
හිමිකමට : බදු පෙර ශුද්ධ ලාභය	%	11.92	19.45	16.54	22.85	14.43	9.26	10.42	22.14	13.25	15.91
මුළු වත්කම් වලට මූල්‍ය වියදම් සහ බදු පෙර ශුද්ධ ලාභය	%	7.55	13.12	12.25	15.30	10.31	7.10	7.82	16.25	10.60	13.32
ජංගම අනුපාතය	වාර	2.52	2.78	4.07	3.58	4.33	4.80	5.40	3.93	5.06	7.72
හිමිකම් : වත්කම් අනුපාතය	වාර	0.63	0.67	0.74	0.67	0.71	0.77	0.75	0.73	0.80	0.84
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය	%	3.64	6.31	0.66	3.84	6.59	12.19	8.00	6.91	14.04	12.09
මුළු ආදායම් වර්ධනය	%	3.88	10.00	9.44	2.40	(3.75)	3.40	(5.13)	37.16	(16.73)	(0.06)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } එන්ඩබ්ඵල්/ජ/එස්ටීඕ/01/එන්ජ/2023/15 මබේ අංකය
உமது இல.
Your No. } දිනය
திகதி
Date } 2024





සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් - 1. ලේකම් - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එන්ඩබ්එල්/ඒ/එස්ටීසී/01/එන්ඒ/2023/15

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 ජූනි 25 දින

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

රාජ්‍ය දැව සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) 1995 වසරේ දී රු.325,000 කට මිලදී ගෙන තිබුණු නෙළුම්දෙණිය ගබඩාව ස්ථාපිත කර ඇති ඉඩම සහ මාතලේ, තලාව, අනුරාධපුර, මැදවච්චිය, කදුරුවෙල හා මින්නේරිය යන ගබඩා පිහිටි සංස්ථාව සතු ඉඩම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, 1969 වර්ෂයේ සිට යාපනය කාර්යාලය හා කැප්පෙටිපොළ කාර්යාලය පවත්වාගෙන යන සංස්ථාව වෙත පවරා තිබුණු නමුත් අයිතිය ඔප්පුවක් මඟින් තහවුරු

නොවන ඉඩම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට ද කටයුතු කර නොනිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මුදලින් කරන ලද සේවක පාරිතෝෂික ගෙවීම් රු.92,567,360 ක් වුවද, එය රු.11,328,488 ක් වශයෙන් රු.81,238,872 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායෑමක් ලෙස දක්වා නිබුණි.

(ඇ) සංස්ථාවේ දෛනික සේවකයන්ට 2022 ට පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු සේවක අර්ථසාධක (EPF) හා සේවක භාරකාර මුදල් (ETF) රු.43,196,324 ක් සඳහා වෙන් කිරීම් කර නොනිබීමෙන් එම වටිනාකමින් සංස්ථාවේ මිමිකම අඩි ගණනය වී වගකීම් ඌන ගණනය වී නිබුණි.

(ඈ) ගෘහ භාණ්ඩ ඒකකයන්ට අදාළ සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.1,770,611 ක් වෙනත් වියදම් වශයෙන් විස්තිර්ණ ආදායම් ප්‍රකාශයට ගැලපීම් හේතුවෙන් එම වටිනාකමින් අඩුළාළ පිරියත හා උපකරණ ක්ෂය අඩුවෙන් හා වෙනත් වියදම් වැඩියෙන් දැක්වුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කර නැවත තක්සේරු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති පිරිවැය රු.924,994,884 ක්වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොනිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 17 අනුව ලාභ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගත යුතු පාරිතෝෂික වියදම රු.48,160,020 ක් වුවද, ලාභ අලාභ ප්‍රකාශයට අදාළ සංයුක්ත ආදායම් ප්‍රකාශනයන් හි පවතින තත්‍ය පාරිතෝෂික වියදම රු.67,250,212 ක් වීමෙන් රු.19,090,192 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව, අවසන් තොග වටිනාකම් පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම්වලින් අඩු අගයට අගය කළ යුතු වුවද, අම්පාර ගෘහ භාණ්ඩ සංකීර්ණයෙහි වෙන්දේසි තොග ලොට් 36 ක රු.1,476,508 ක් වූ ශුද්ධ උපලබ්ධි අගය ඉක්ම වූ රු.2,467,626 ක පිරිවැය අගයට තොගය ගිණුම්ගත කර නිබීම හේතුවෙන් ජංගම වත්කම් හා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය රු.991,118 ක් බැගින් අධිගණනය වී නිබුණි.

(ඌ) සංස්ථාවේ මහජන බැංකු ගිණුමට සෘජුව බැර වී නිබුණු රු.1,464,814 ක මුදලක් හඳුනා ගැනීමට නොහැකිව නිබිය දී ආයෝජන ආදායම් ලෙස ගිණුම්ගත කර නිබීමෙන් එම අගයෙන් ආයෝජන ආදායම අඩි ගණනය වී නිබුණි.

(ඒ) පල්ලේකැලේ නිෂ්පාදනාගාරයේ නිෂ්පාදනය වෙමින් පැවති අර්ධ නිමි භාණ්ඩ භෞතිකව සත්‍යාපනය නොකිරීම හේතුවෙන් ඒවාට අදාළ කෙරිගෙන යන වැඩ වටිනාකම හා නිමි තොග මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වී නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව විගණනයේදී ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද. අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර. එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ 1.2 (ඉ) හා (උ) ඡේදයන්හි

දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති,රීති / විධානයට යොමුව	නිරීක්ෂණ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(3)	බණ්ඩාරවෙල ප්‍රාදේශීකයට අයත් වැඩබිම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් නඩත්තු කළ වසර 2 ක කාලයක් ඉක්මවා තිබුණු රු.1,012,292 ක ඇප තැන්පත් මුදල් පියවීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) පල්ලේකැලේ නිෂ්පාදනාගාරයේ Dust collector යන්ත්‍රයක් හා වන අපරාධවලට සම්බන්ධ උසාවියෙන් නිදහස් කර තිබූ ජංගම ලී ඉරුම්හල් 03 ක්, වසර ගණනාවක සිට හාවිතයෙන් තොරව නිෂ්කාර්යව දිරාපත්වීමට ඉඩහැර තිබුණි.

(ආ) අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගැනීමෙන් තොරව 2023 වර්ෂයේ දී සංස්ථාව විසින් මිලදීගත් රු.35.800,075 ක් වටිනා, ප්‍රාදේශීය කාර්යාල 13 ක් වෙත බෙදා හැර තිබුණු දම්වැල් කියත් (chain saw) 100 කින් සියයට 75 ට වැඩි ප්‍රමාණයක් කාර්යක්ෂමව භාවිතයට ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් නොකිරීම හේතුවෙන් ඌණ උපයෝජිතව පැවතුණි.

(ඇ) 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ මහ පෙන්වීම් ප්‍රකාරව වන අපරාධ දැව සම්බන්ධයෙන් කටයුතු නොකිරීම හේතුවෙන්, වන අපරාධ දැව විනාශ වීම, දැව කළමණාකරණය හා ගබඩා පහසුකම් කළමනාකරණය කර ගැනීම අපහසු වීම වැනි අසීරුතාවලට සංස්ථාව මුහුණ පා සිටින අතර මහනුවර ප්‍රාදේශිකයට අදාළව පමණක් කඳන් දැව ඝන ඩෙසිමීටර් 159.904 ක් සහ ඉරු දැව ඝන ඩෙසිමීටර් 30.933 ක් දිරාපත් වෙමින් ද, ගබඩා ඉඩ පහසුකම් ඇනිරී ගොස් ද තිබුණු බවට නිරීක්ෂණය විය.

(ඈ) පරිත්‍යාග වශයෙන් ලැබෙන දැව ඉවත් කර ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේදී ඉවත් කිරීම් 1,157 ක් සඳහා රු.41.854.672 ක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට සිදුවී තිබුණි.

(ඉ) සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ ගිණුමේ පැවති රු.966.058.091 ක ශේෂය තුළ පැවති වසරක සිට වසර 04කට වැඩි කාලයක් ඉක්ම වූ රු.240.299.687 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර නොතිබූ තනතුරු 8 ක සේවකයන් 23 දෙනෙක් සඳහා සමාලෝචිත වර්ෂය තුල දී පත්වීම් ලබා දී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

වාර්ෂික ගිණුම්

ලාභ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2023 රු.	2022 රු.
පිරිවැටුම	2	4,092,128,811	4,743,049,736
විකුණුම් පිරිවැය	3	(2,183,219,570)	(2,452,074,230)
මෙහෙයුම් මත දළ ලාභය		**1,908,909,241**	**2,290,975,506**
වෙනත් ආදායම්	6		
මෙහෙයුම්	6.3	95,255,751	33,259,919
මෙහෙයුම් නොවන	6.1	14,568,317	14,953,721
මුළු ශුද්ධ ආදායම		**2,018,733,309**	**2,339,189,147**
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	4	(729,542,520)	(955,435,355)
පරිපාලන වියදම්	5	(959,724,662)	(1,039,084,313)
මූල්‍ය වියදම		(1,082,440)	(2,844,101)
මූල්‍ය ආදායම	6.2	945,351,151	674,160,950
භාණ්ඩාගාර බදුවලට පෙර ශුද්ධ ලාභය		**1,273,734,838**	**1,015,986,328**
වර්ෂය සඳහා ආදායම් බදු	7	(117,943,033)	(380,105,005)
භාණ්ඩාගාරයට ගෙවූ බදු		1,155,791,805	635,881,323
		(649,461,969)	(320,000,000)
වර්ෂය සඳහා ලාභය		**506,329,836**	**315,881,323**
වෙනත් විස්තීරණ ආදායම්			
විශ්‍රාමික පාරිතෝෂික අතිරික්ත/ඌණතා	17	(164,697,250)	347,392,072
වෙනත් විස්තීරණ ආදායම්		**(164,697,250)**	**347,392,072**
මුළු විස්තීරණ ආදායම්		**341,632,586**	**663,273,395**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

